# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,891—1970 ජනවාරි 29 වැනි බ්‍රහස්පතින්ද—1970.1.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය .. ... | 61 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 62 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 62 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 65 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 66 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වැඩකම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 79 |
| '' සුරාබද්දු ආඥාපනත '' පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 29

අංකය : ඩී. 251/ආර්ජීසිඑ/5.

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම් හා පත්කිරීම්

#### උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් 1967 නොවැම්බර් මස 15 වැනි දින සිට ලුතිනන් කර්නල් වරුන් වශයෙන් :—

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ඉයුස්ටස් පෙඩ්රික් ජැන්සන්, ල.ඉ.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ජෝන් ඩෙන්සිල් සොයිසා, එම්.බී.ඊ., ල.පා.හ.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) තුවන් සමයිංගාන් බුහාරි සලී, ල.සි.රෙ.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) දිගානන්ත්‍රිගේ එඩ්මන්ඩ් ද සිල්වා, ල.යු.සේ.බ.

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙහි දක්වා ඇති දිනයන්හි සිට, තාවකාලික ලුතිනන් කර්නල් වරුන් වශයෙන් :—

මේජර් ක්ලින්ටන් චාර්ල්ස් ලැබ්‍රොයි, ල.සි.රෙ.—1969 ජූනි මස 1 වැනි දින.

මේජර් ජෝසප් එවරාඩ් ඩෙනිස් පෙරේරා, ල.ඉ.—1969 ඔක්තෝබර් 1 වැනි දින.

මේජර් ලෝරන්ස් ජස්ටින් ඉග්නේෂස් ප්‍රනාන්දු, ල.ස.බ.—1969 ඔක්තෝබර් 1 වැනි දින.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

මේජර් බැස්ටියන් කෝරාලලාගේ වික්ටර් ජස්ටස් එතල්රඩ් රුද්‍රිගු, ල.කා.හ.—1969 ඔක්තෝබර් 1 වැනි දින.

මේජර් ඇන්තනි පයස් රත්නරාජා ඩේවිඩ්, ල.පා.හ.—1969 ඔක්තෝබර් 1 වැනි දින.

මේජර් තිස්ස ඉන්ද්‍රක වීරතුංග, ගැ.හේ.බ.—1969 ඔක්තෝබර් 1 වැනි දින.

මේජර් ඩුලිප් ජස්ටින් ද සිල්වා වික්‍රමනායක, ල.කා.හ.—1969 නොවැම්බර් 1 වැනි දින.

මේජර් සෝමවීර ඩෙනිස්ටර් නානායක්කාරවසන් හපුගල, ල.ස.ස.බ.—1969 නොවැම්බර් 1 වැනි දින.

මේජර් සුගතපාල සිරිල් රණතුංග, ල.ස.ස.බ. —1969 නොවැම්බර් 1 වැනි දින.

පත්කිරීම්

ලුතිනන් කර්නල් ජෝන් ඩෙන්සිල් සොයිසා, එම්.බී.ඊ., ල.පා.හ.—1967 නොවැම්බර් මස 15 වැනි දින සිට යුද හමුද මූලස්ථානයේ සහකාර විධායක අධිකාරි (නීති) වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ක්ලින්ටන් චාර්ලස් ලැබ්‍රොයි, ල.සි.රෙ.—1969 ජූනි මස 1 වැනි දින සිට ලංකා යුද හමුද පොදු සේවා බලකායේ අණ දෙන නිලධාරි වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ජෝසප් එවරාඩ් ඩෙනිස් පෙරේරා, ල.ඉ.—1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට යුද හමුද අභ්‍යාස මධ්‍යස්ථානයේ සේනා විධායක වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ලෝරන්ස් ජස්ටින් ඉග්නේෂස් ප්‍රනාන්දු, ල.ස.බ.—1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1 වැනි රෙජිමේන්තුව, ලංකා සංඥ බලකායේ අණ දෙන නිලධාරි වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) බැස්ටියන් කෝරාලලාගේ වික්ටර් ජස්ටස් එතල්රඩ් රුද්‍රිගු, ල.කා.හ.—1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට නීති විරෝධීව ආගමනය කරන්නන් මැඩලීමේ යුද හමුද බලසේනාව, මන්නාරමහි ආඥපති වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ඇන්තනි පයස් රත්නරාජා ඩේවිඩ්, ල.පා.හ.—1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1 වැනි බලඇණිය, ලංකා පාබල හමුදවේ අණ දෙන නිලධාරි වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) තිස්ස ඉන්ද්‍රක වීරතුංග, ගැ.හේ.බ.—1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1 වැනි ගැමුණු හේවා බල ඇණියේ අණ දෙන නිලධාරි වශයෙන්.

මේජර් වල්ලිපුරම් රාමනාදන්, ල.කා.හ.—1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට සහකාර විධායක හා උපකරණ පාලක අධිකාරි (ලංකා ස්වේච්ඡා බල සේනාව) වශයෙන් වැඩ බැලීම.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ඩුලිප් ජස්ටින් ද සිල්වා වික්‍රමනායක, ල.කා.හ.—1969 නොවැම්බර් මස 1 වැනි දින සිට ලංකා යුද හමුද පොලිස් සේවා බලකායේ අණ දෙන නිලධාරි වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) සෝමවීර ඩෙනිස්ටර් නානායක්කාරවසන් හපුගල, ල.ස.ස.බ.—1969 නොවැම්බර් මස 1 වැනි දින සිට 1 වැනි විමර්ශන රෙජිමේන්තුව, ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ අණ දෙන නිලධාරි වශයෙන්.

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) සුගතපාල සිරිල් රණතුංග, ල.ස.ස.බ.—1969 නොවැම්බර් මස 1 වැනි දින සිට යුද හමුද මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරි 1 වැනි ශ්‍රෙණිය වශයෙන්.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ,
ස්ථිර ලේකම්.

1970 ජනවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

1–581

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1970 අංක 30

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්වීම් නියෝග කර ඇත :—

ඒ. 32/69

ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී, ලංකා පරිපාලන සේවයේ වී. දේවේන්ද්‍ර මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1969 නොවැම්බර් මස 7 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, හම්බන්තොට පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත ලෙස වැඩ බැලීමට.

ඒ. 32/69

ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී, ලංකා පරිපාලන සේවයේ වී. දේවේන්ද්‍ර මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1969 නොවැම්බර් මස 5 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, මොණරාගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත ලෙස වැඩ බැලීමට.

ඒ. 32/69

ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී, ලංකා පරිපාලන සේවයේ වී. දේවේන්ද්‍ර මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1969 නොවැම්බර් මස 3 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, රත්නපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත ලෙස වැඩ බැලීමට.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංක 500, කොළඹ 1.
1970 ජනවාරි මස 20 වැනිදා.

1–516

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 31

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ—

අංකය : ජේඒ. 14/48 (1).

ඩී. එස්. නෙත්සිංහ මහතා ඔහුගේ වෙනත් රාජකාරී වලට අතිරේක වශයෙන්, කොළඹ ඒකබද්ධ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 43192 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දු දීම පිණිස, 1970 ජනවාරි මස 10 දින සිට කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඒ. 39/48.

ආර්. නවරත්නම් මහතා ඔහුගේ වෙනත් රාජකාරී වලට අතිරේක වශයෙන්, මන්නාරම ම. උ. අංක 2787 සහ 5501 දරණ නඩුවල තීන්දු දීම පිණිස 1970 ජනවාරි මස 29 දින් සිට මන්නාරමේ සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 18/56.

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. එස්. පී. ද එස්. ගුණසේකර මහතා 1970 ජනවාරි මස 10 වැනි දින සහ 13 වැනි දිනයන් හී, බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 28/62.

කේ. වී. ස්වර්ණාධිපති මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ සී. අමරසිංහ මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සහ 4 වැනි දිනයන් හී, කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්,

අංකය : ජේඑල්/ඩී. 24/62.

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. විශ්වනාදන් මහතා 1970 ජනවාරි මස 4 දින සිට 6 වැනි දින දක්වා, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන කයිට්ස්හි අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංකය : ජේඑ් 48/48.

ඩබ්ලිව්. ජේ. පොන්සේකා මහතා 1970 ජනවාරි මස 2 දින පානදුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. වී. විල්වරාජා මහතා 1970 ජනවාරි මස 14 වැනි දින සිට 16 වැනි දින දක්වා, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 2/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සිමම්පිල්ලේ මහතා 1970 ජනවාරි මස 22 වැනි දින සිට 23 වැනි දින දක්වා, මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 13/67.

එම්. ජේ. ටී. සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ඕ. ඒ ද සිල්වා මහතා 1970 ජනවාරි මස 11 සහ 12 වැනි දිනයන් හි, ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිට කෝරලේ සහ වැල්ලබඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 13/67.

එම්. ජේ. ටී. සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, උපාලි වේලාරත්න මහතා 1970 ජනවාරි මස 10 වැනි දින, ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිට කෝරලේ සහ වැල්ලබඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 13/67.

එම්. ජේ. ටී. සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජී. පී. ඩී. අමරසිංහ මහතා 1970 ජනවාරි මස 9 දින, ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරලේ සහ වැල්ලබඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 13/61.

එම්. ජේ. ටී. සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. කේ. ආර් ද එස්. රාමචන්ද්‍ර මහතා 1970 ජනවාරි මස 4 වැනි දින සිට 6 වැනි දින දක්වා, ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරලේ සහ වැල්ලබඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 13/61.

එම්. ජේ. ටී. සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ජී. පී. කරුණාරත්න මහතා 1970 ජනවාරි මස 3 වැනි දින ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරලේ සහ වැල්ලබඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 3/58.

සී. ඊ. ඒ. ගුණසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. එස්. රාජපක්ෂ මහතා 1970 ජනවාරි මස 6 වැනි දින, නුවර එළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ වලපනේ සහ නුවර එළිය ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශයන් හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. වී. විල්වරාජා මහතා 1970 ජනවාරි මස 16 වැනි දින, වව්නියා සහ මන්නාරම් දිස්ත්‍රික්කයන් හි වව්නියා දකුණ ගම්බද උසාවි සභාපති සහ මාන්තෙයි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

මගේ අංකය : පීඑල්/එස්. 1/56.

ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඒ. යටවර මහතා 1970 ජනවාරි මස 13 වැනි දින, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර ගම්බද උසාවි සභාපති සහ මාතලේ නැගෙනහිර අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 5/61.

සී. ආර්. රාජසිංහම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. අරසකෝන් මහතා 1970 ජනවාරි මස 16 වැනි දින සිට 19 වැනි දින දක්වා, මඩකලපුව දිස්ත්‍රික්කයේ එරුවිල් පොරතිවු සහ දකුණු මාම්මුනෙයි පත්තු ගම්බද උසාවි සභාපති සහ උතුරු මාම්මුනෙයි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 6/67.

එස්. රාජනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එච්. එම්. ජෞපර් මහතා 1970 ජනවාරි මස 16 වැනි දින සහ 17 වැනි දිනයන් හි, මඩකලපුව දිස්ත්‍රික්කයේ පානම සහ අක්කරෙයිපත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එම්. 8/68.

එච්. එම්. එස්. බී. මඩවල මහතා නැති අතර හෝ නැවත කරන තුරු, ඩී. එම්. ජයසූරිය මහතා 1970 ජනවාරි මස 8 වැනි දින සිට 13 වැනි දින දක්වා, තංගල්ල දිස්ත්‍රික්කයේ මාගම් පත්තුව, නැගෙනහිර ගිරුවා පත්තුව, උතුරු ගිරුවා පත්තුව සහ දකුණු ගිරුවා පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන් හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 9/53.

පී. බී. පී. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඒ. ඊ. පින්තු මහතා 1970 ජනවාරි මස 13 වැනි දින, පුත්තලම් දිස්ත්‍රික්කයේ පුත්තලම් පත්තු හා කඩවත් කල්පිටිය, රාජවන්නි සහ කුමාරවන්නි පළාත, ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන් හි ගම්බද උසාවි සභාපති වශයෙන් සහ පිටිගල් කෝරලේ උතුරු ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය: පීඑ්/39/57.

එන්. සී. රාජපක්ෂ මහතා 1970 ජනවාරි මස 24 වැනි දින සිට අඹන්පොල ගම්බද උසාවියේ අංක අ/5907 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව නිකවැරටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශයන් හි අතිරේක ගම්බද උසාවි සභාපති සහ හිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 2/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සීමම්පිල්ලේ මහතා 1970 ජනවාරි මස 21 වැනි දින, මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරමේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී එල්/ඩී. 10/61.

ඩබ්ලිව්. බී. දසනායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. ද වාස් මහතා 1970 ජනවාරි මස 16 වැනි දින, ගම්පහ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරලේ බටහිර සියනෑ කෝරලේ (මැද පත්තුව) සහ හාපිටිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ දකුණු අළුත් කුරු කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

සීජේකිව්/ඒ. 23/68.

1970 ජනවාරි මස 17 වැනි දින සිට මාස දෙකක් හෝ, ඒ. මොහිඩීන් මහතා දිවයිනට පැමිණෙන තෙක්, එම්. එල්. ජමාල් ඩීන් ලෙබ්බේ මහතා ඔහුගේ වෙනත් රාජකාරීවලට අතිරේක වශයෙන්, වව්නියා අධිකරණ කොට්ඨාශයේ ක්වාසි වශයෙන් වැඩ බැලීමට.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජනවාරි මස 20 දා
කොළඹ 12,
තැ. පෙ. අංකය 573,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී.

1-499

# වෙනත් පත් කිරීම් ආදිය

**1970 අංක 32**

පා 4/සාවි 2/344, පා 4/සාවි 37/87, පා 4/සාවි 22/2,
පා 4/සාවි 28/90, පා 4/සාවි 32/52, පා 4/සාවි 14/74,
පා4/සාවි 2/316.

## අධිකරණ ආඥාපනත

**82 වන වගන්තිය යටතේ දැන්වීම**

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ඇලෙක්සැන්ඩර් ෆෙයාර්ලි විජේමාන්න වන මම,

1. ගොඩේ විතානගේ ජේම්ස් අප්පුහාමි වික්‍රමසිංහ මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදන විනිශ්වයකාරවරයෙකු වශයෙන්ද,
2. හේවාගොඩගේ විජේවන්ත මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදන විනිශ්වයකාරවරයෙකු වශයෙන් ද,
3. ඇම්. පී. ඇම්. මොහොමඩ් කාසිම් අලිම් මහතා මන්නාරම අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදන විනිශ්වයකාරවරයෙකු වශයෙන් ද,
4. රත්නායක මුදියන්සේලාගේ මුදියන්සේ මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදන විනිශ්වයකාරවරයෙකු වශයෙන් ද,
5. දෙන් හෙන්රි යාපා අභයවර්ධන මහතා අනුරාධපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදන විනිශ්වයකාරවරයෙකු වශයෙන් ද,
6. උරනේලිස් කොඩිතුවක්කු මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදන විනිශ්වයකාරවරයෙකු වශයෙන් ද,
7. පහලවත්තගේ දෙන් කරුණාරත්න මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදන විනිශ්වයකාරවරයෙකු වශයෙන් ද,

පත් කරමි.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1970 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

1–483/1

---

**1970 අංක 33**

පා 4/සාවි.නිල 29, පා 4/සාවි.නිල 18, පා 4/සාවි.නිල 20,
පා 4/සාවි.නිල 2, පා 4/සාවි.නිල 37, පා 4/සාවි.නිල 33,
පා 4/සාවි.නිල 9, පා 4/සාවි.නිල 4, පා 4/සාවි නිල 5,
පා 4/සාවි.නිල 46, පා 4/සාවි.නිල 19.

## අධිකරණ ආඥාපනත

**82 වන වගන්තිය යටතේ දැන්වීම**

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ඇලෙක්සැන්ඩර් ෆෙයාර්ලි විජේමාන්න වන මම, පහත සඳහන් නිලධාරීන් ඔවුන් දැනට දරණ තනතුරුවල සේවය කරණ තාක් කල් ඒ ඒ අධිකරණ දිස්ත්‍රික්කයන් සඳහා සාමදන විනිශ්වයකාරවරුන් වශයෙන් පත් කරමි.

| | නම | දැනට දරණ තනතුර | පත්කර ඇති අධිකරණ දිස්ත්‍රික්කය |
|---|---|---|---|
| 1. | මුරුගේසු නඩරාජා මහතා ... ... | යුද හමුදාවේ වැඩබලන සිවිල් පරිපාලක නිලධාරි හා ගණකාධිකාරි ... | කොළඹ |
| 2. | එල්. ඒ. ජයවර්ධන මහතා ... ... | මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කායඝාල සහකාර ... ... | කොළඹ |
| 3. | ෂහුල් හමීඩ් මොහමඩ් සුබෙර් ෆාරුක් මහතා ... | සහකාර පෝස්ට්මාස්ටර් ජනරාල් (පරිපාලන) ... ... | කොළඹ |
| 4. | ඇස්. ආර්. ප්‍රනාන්දු මහතා ... ... | ජාතික නිවාස සහකාර කොමසාරිස් ... ... ... | අනුරාධපුර |
| 5. | කපිතාන් ජී. ඕ. හෙන්රිකස් මහතා ... ... | කොළඹ වරාය කොමිෂන් සභාවේ මාස්ටර් ඇටෙන්ඩන්ට් ... | කොළඹ |
| 6. | එම්. ඒ. පී. සමරසේකර මහතා ... ... | කොළඹ දිස්ත්‍රික්කයේ අතිරේක සහකාර ආණ්ඩුවේ ඒජන්ත ... | කොළඹ |
| 7. | ජී. අමරසේන මහතා ... ... ... | ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ ලේකම් ... ... | කොළඹ |
| 8. | එඩ්වර්ඩ් ඇලෝසියස් සිල්වෙස්ටර් විල්ෆ්‍රඩ් පෙරේරා මහතා | වැලිකඩ බන්ධනාගාරයේ අධිකාරි ... ... ... | කොළඹ |
| 9. | මුරුගේසුපිල්ලේ සෝමසුන්දරම් මහතා ... | රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සමාගමේ සභාපති ... | කොළඹ |
| 10. | අබ්දුල් මජීඩ් මොහමඩ් සහබ්දීන් මහතා ... | කම්කරු වන්දි කොමසාරිස් ... ... ... | මුළු දිවයින |
| 11. | ජේ. වයි. ඩී. ද සිල්වා මහතා ... ... | අල්ලස් විනිශ්වය සභා ලේකම් ... ... ... | කොළඹ |

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1970 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

1–483/2

**1970 අංක 34**

පා 4/සාවි 16/63, පා 4/ සාවි 38/98, පා 4/සාවි 35/66,
පා 4/සාවි 9/133, පා 4/සාවි 23/8. පා 4/සාවි 37/96,
පා 4/සාවි 37/104, පා 4/සාවි 6/23, පා 4/සාවි 2/290,
පා 4/සාවි 28/109.

## අධිකරණ ආඥාපනත

**82 වන වගන්තිය යටතේ දැන්වීම**

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ඇලෙක්සැන්ඩර් පෙයාර්ලි විජේමාන්න වන මම,—

(1) රත්නායක ආරච්චිගේ පියදාස රත්නායක මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(2) පට්ටිවිදානෙලාගේ පොඩිනිලමේ ගරාගොඩ මහතා අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(3) විදානෙගේ ජෝන් වීරසිංහ මහතා බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(4) අළුදෙනියේ මහමුදන්නායක මුදියන්සේලාගේ ආනඳ මුදන්නායක මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(5) සින්නතම්බි වේතරානියම් මහතා වවුනියා අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද

(6) හීරළු මොහොට්ටාලලාගේ පුංචි මනන්මයා මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(7) වාලප්පුලි මුදියන්සේලාගේ ධර්මසේන බණ්ඩාර මානිපුර මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(8) මහන්තේ ආචාරිගේ ලුවිස් පෙරේරා මහතා අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(9) සැලිබෝයි හුසේන්බෝයි මුසාජී මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(10) කැමිල් ඩැන්වර් පූටන් මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

පත් කරමි.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1970 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

1-704/1

අංකය. පා 4/සාවි 3/128.

## නිවැරදි කිරීම

1969 නොවැම්බර් මස 28 වැනි දින අංක 14,882 දරණ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (I) වැනි ඡේදයේ 932 වැනි පිටුවේ 1969 අංක 37බී දරණ දැන්වීමේ "3. මෙස්ටියගේ දොන් කරෝලිස් ගුණතිලක මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද," යන්න වෙනුවට "3. මැස්ටියගේ දොන් කරෝලිස් ගුණතිලක මහතා පානදුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද," යන්න ආදේශ කිරීමෙන් සංශෝධනය කරණු ලැබේ.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1970 ජනවාරි මස 16 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

1-704/2

---

**1970 අංක 35**

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ඔලිවර් නිව්ටන් විදුරාගල මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුලත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

ආ. එ. ගෝගලි මොරගොඩ,
සභිර ලේකම්,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1970 ක්වූ ජනවාරි මස 18 වැනි දින,
කොළඹ දීය.

1-825/1

---

**1970 අංක 36**

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

නෙවිල් හෙන්රි ප්‍රනාන්දු මහතා කළුතර අධිකරණ කොට්ඨාශය ඇතුලත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

ආ. එ. ගෝගලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ක්වූ ජනවාරි මස 11 වැනි දින,
කොළඹ දී ය.

1-696

---

## ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඩී.—බී. 91/49 අංකය : ඩී. 89/ඩීඅයිඑස්ඩී.

**යුද්ධ හමුදා පනත**

(357 වෙනි අධිකාරය වන) යුද්ධ හමුදා පනතේ 155 වෙනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් 23 දින,
කොළඹ දීය.

### නියෝගය

1950 සැප්තැම්බර් මස 22 වෙනි දින අංක 10,154 දරන ගැසට් පත්‍රයේ පළකොට වරින්වර සංශෝධනය කළ 1950 යුද්ධ හමුදා විනය නියෝගවල 39 වෙනි නියෝගයෙහි "ඉරු දින, මහ සිකුරාද හා නත්තල් දිනය" යන වචන වෙනුවට "පෝය දිනයන් හා රජයේ නිවාඩු දිනයන්" යන වචන ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**සැළකිය යුතුයි: අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකල සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගයසේ සැළකිය යුතුයි.**

---

ඇල්.ඩී.—බී. 91/49. අංකය : ඩී. 89/ඩී.අයිඑස්සී.

## යුද්ධ හමුදා පනත

(357 වෙනි අධිකාරය වන) යුද්ධ හමුදා පනතේ 155 වෙනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් 23 දින,
කොළඹ දීය.

### නියෝගය

1950 ඔක්තෝබර් මස 10 වෙනි දින අංක 10,163 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ යුද්ධාධිකරණ (මහා හා දිස්ත්‍රික්ක) නියෝගවල 21 වෙනි නියෝගයෙහි (4) වෙනි ඡේදයේ "ඉරු දින, නත්තල් දිනය හෝ මහා සිකුරාදා" යන වචන වෙනුවට "පෝය දිනයන් හෝ රජයේ නිවාඩු දිනයන්" යන වචන ඇදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**සැළකිය යුතුයි: අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකල සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගය සේ සැළකිය යුතුයි.**

---

ඇල්.ඩී.—බී. 91/49 අංකය : ඩී. 89/ඩීඅයිඑස්සී.

## යුද්ධ හමුදා පනත

(357 වෙනි අධිකාරය වන) යුද්ධ හමුදා පනතේ 155 වෙනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් 23 දින,
කොළඹ දීය.

### නියෝගය

1952 නොවැම්බර් මස 7 වෙනි දින අංක 10,468 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1952 යුද්ධ හමුදා පරීක්ෂණ අධිකරණ නියෝගවල 7 වෙනි නියෝගයේ (2) වෙනි ඡේදයෙහි "පැවැත්විය නොයුතු" යන වචන වෙනුවට "පෝය දිනවල, රජයේ නිවාඩු දිනවල හෝ පැවැත්විය නොයුතු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**සැළකිය යුතුයි: අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකල සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගයසේ සැළකිය යුතුයි.**

---

ඇල්.ඩී.—බී. 91/49 අංකය : ඩී. 89/ඩීඅයිඑස්සී.

## යුද්ධ හමුදා පනත

(357 වෙනි අධිකාරය වන) යුද්ධ හමුදා පනතේ 155 වෙනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් 23 දින,
කොළඹ දීය.

### නියෝගය

1957 නොවැම්බර් මස 8 වෙනි දින අංක 11,193 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ වරින්වර සංශෝධිත, 1957 යුද්ධ හමුදා නිවාඩු දුම්රිය බලපත්‍ර නියෝගවල 2 වෙනි නියෝගයේ (1) වෙනි ඡේදයේ (ඇ) අනුඡේදයේ "සති අන්තයකදී" යන වචන වෙනුවට "පෝය දිනකට පෙර දින සිට" යන වචන යෙදීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**සැළකිය යුතුයි: අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකල සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගය සේ සැළකිය යුතුයි.**

---

ඇල්.ඩී.—බී. 126/50 අංකය : ඩී. 89/ඩීඅයිඑස්සී.

## නාවික හමුදා පනත

(358 වන අධිකාරය වන) නාවික හමුදා පනතේ 161 වන වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් 23 දින,
කොළඹ දීය.

### නියෝගය

1957 නොවැම්බර් 8 වන දින අංක 11,193 දරණ ගැසට් පත්‍රයෙහි පළ කොට, කලින් කල සංශෝධනය කරනු ලැබූ 1957 නාවික හමුදා නිවාඩු සහ නිවාඩු දුම්රිය බලපත්‍ර නියෝග, එහි 2 වන නියෝගයෙහි (1) වන ඡේදයෙහි (ඇ) අනුච්ඡේදයෙහි "සති අන්තයකදී" යන වචන වෙනුවට "පෝය දිනකට පෙර දින ආරම්භව" යන වචන ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**සැළකිය යුතුයි: අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකල සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගයසේ සැළකිය යුතුයි.**

---

ඇල්.ඩී.—බී. 130/50 අංකය : ඩී. 89/ඩීඅයිඑස්සී.

## ගුවන් හමුදා පනත

(359 වැනි අධිකාරය වන) ගුවන් හමුදා පනතේ 155 වැනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවනු ලබන නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් 23 දින,
කොළඹ දීය.

### නියෝගය

1952 සැප්තැම්බර් 19 වෙනි දින අංක 10,449 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ යුද්ධාධිකරණ (මහා හා දිස්ත්‍රික්ක) නියෝග, ඒ නියෝගවල 167 වැනි නියෝගයේ (4) වැනි ඡේදයේ "ඉරු දින, නත්තල් දිනය හෝ මහ සිකුරාදා" යන වචන වෙනුවට "පෝය දිනයන් සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**සැළකිය යුතුයි: අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකල සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගයසේ සැළකිය යුතුයි.**

ඇල්. ඩී.—බී. 130/50. අංකය : ඩී. 89/ඩීඅයිඑස්සී.

## ගුවන් හමුදා පනත

(359 වැනි අධිකාරය වන) ගුවන් හමුදා පනතේ 155 වැනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවනු ලබන නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් 23 දින,
කොළඹ දීය.

**නියෝගය**

1952 සැප්තැම්බර් 19 වෙනි දින අංක 10,449 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ ගුවන් හමුදාවේ (හිර භාර සේවා මඩම්) නියෝග, එහි 16 වැනි නියෝගයේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ) සහ (උ) යන අනුච්ඡේද වෙනුවට පහත සඳහන්

"පෝය දිනයන් සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්"

යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**සැළකිය යුතුයි : අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකළ සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගය සේ සැළකිය යුතුයි.**

---

ඇල්. ඩී.—බී. 130/50 අංකය : ඩී/89/ඩීඅයිඇස්සී.

## ගුවන් හමුදා පනත

(359 වැනි අධිකාරය වන) ගුවන් හමුදා පනතේ 155 වැනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවනු ලබන නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් 23 දින,
කොළඹ දීය.

**නියෝගය**

1957 නොවැම්බර් 8 වන දින අංක 11,193 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ කලින් කල සංශෝධිත 1957 ගුවන් හමුදා නිවාඩු සහ නිවාඩු බලපත්‍ර නියෝග, ඒ නියෝගවල 2 (1) වැනි නියෝගයේ (ඇ) අනුච්ඡේදයේ "සති අන්තයකදී" යන වචන වෙනුවට "පෝය දිනකට පෙර දින සිට" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**සැළකිය යුතුයි : අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකළ සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගය සේ සැළකිය යුතුයි.**

---

ඇල්. ඩී.—බී. 90/34

අංකය : ඩී/වීඑෆ්/38/ඒ.

## යුද්ධ හමුද පනත

(357 වෙනි අධිකාරය වන) යුද්ධ හමුදා පනතේ 155 වෙනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමති වෙත පැවරී ඇති බලතල අනුව ඔහු විසින් පනවනු ලැබූ නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් 15 දින,
කොළඹ දීය.

**නියෝගය**

1934 අගෝස්තු මස 24 වැනි දින අංක 8,074 දරන ගැසට් අතිරේකයේ පළ කරන ලද සහ යුද්ධ හමුද පනතේ 156 දරන වගන්තිය යටතේ ඉදිරියටත් බල පවත්නා හා වරින්වර සංශෝධනය කරන ලදුව ලංකා ආරක්ෂක බලසේනා ආඥාපනතේ 9 සහ 12 වැනි වගන්ති යටතේ ලංකා ආරක්ෂක බලසේනාවට අදාල නියෝග, එහි 33 නියෝගය වෙනුවට පහත සඳහන් අලුත් නියෝගය ආදේශ කිරීමෙන් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

"33. පළමුවෙනි අධිකාරිය සඳහා ඉල්ලුම්කරුවන්—

(අ) පොදු රාජකාරි නිලධරයන් වශයෙන් වයස අවුරුදු 21 සහ 25 වත් අතර ද,

(ආ) කාර්මික නිලධරයන් වශයෙන් වයස අවුරුදු 21-40 වත් අතර ද,

විය යුතුය. ඔවුන් ලංකා පුරවැසියන් විය යුතුයි. නිර්දේශයත් පහත සඳහන් ලේඛන සමග ඉදිරිපත් කළ යුතුයි:—

(i) ශරීරික යෝග්‍යතාව සඳහා වෛද්‍ය සහතිකයක්.

(ii) හොඳ චරිතය සම්බන්ධව සහතික පත් දෙකක්.

(iii) සම්පූර්ණ නම, වයස, උස ප්‍රමාණය, පදිංචි ස්ථානය, අධ්‍යාපනය ලබාගත් ස්ථානය සහ ඉල්ලුම්කරුගේ රක්ෂාව/වෘත්තිය සම්බන්ධව යු. හා. පා. 55 පත්‍රයක සියලුම විස්තර වාර්තාවක්.

(iv) අධිකාරී නිලධරයකු වශයෙන් හෝ සෙබලකු වශයෙන් හෝ නාවික, යුද්ධ හෝ ගුවන් හමුදවල කලින් සේවය කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර.".

**සැළකිය යුතුයි : අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකළ සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගය සේ සැළකිය යුතුයි.**

---

එල්. ඩී.—බී. 91/49. අංකය : ඩී 270/2/ආර්ර්සීපී.

## යුද්ධ හමුද පනත

(357 වෙනි අධිකාරය වන) යුද්ධ හමුදා පනතේ 155 වෙනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති වරයා විසින් පනවනු ලබන නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් 16 වන දින,
කොළඹ දීය.

**නියෝගය**

1961 සැප්තැම්බර් මස 25 දින අංක 12,673 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබ, වරින්වර සංශෝධනය කරන ලද 1961 යුද්ධ හමුද වෛද්‍ය හා දන්ත වෛද්‍ය නිලධාරීන් පිළිබඳ නියෝග, එහි 10 වැනි නියෝගයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් නියෝගය ඇතුලත් කිරීමෙන්, තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"10අ. (1) මේ නියෝගවල විරුද්ධව කුමක් සඳහන් වුවද මෙහි මින්මතු විධිවිධාන යොදා ඇති ආකාරයට යටත්ව, ආදි ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියකු විසින්, 1966 සැප්තැම්බර් මස 4 වැනි දින අංක 700 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව රාජ්‍ය භාෂාවෙන් කටයුතු කිරීමට තමා අපොහොසත් ය යන කරුණ හේතුකොටගෙන, විශ්‍රාම ගැනීමට තීරණය කළ හැකිය:

එසේ වුවද, යම් නිලධාරියකු සේවයේ රඳවා ගැනීම යුද්ධ හමුදාවේ ප්‍රයෝජනය පිණිස අත්‍යවශ්‍ය යයි අග්‍රාණ්ඩුකාරවරයාගේ මතය නම්, ස්ථිර ලේකම් විසින් එකී නිලධාරියාගේ විශ්‍රාම ගැනීම ප්‍රතික්ෂෙප කළ හැකිය.

(2) 1966 සැප්තැම්බර් මස 4 දින අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, යුද්ධ හමුදවේ සියලුම නව ප්‍රවේශක වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධරීන් කෙරෙහි අදාල විය යුතුය.

(3) ස්ථිර ලේකම්ගේ එකගත්වය ඇතිව, යුද්ධ හමුදාධිපති විසින් නිශ්චය කරන ලද කාලසීමාවක් තුළදී රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් නොවූ කිසිම නව ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියකුට ඔහුගේ නිලයට නියමිත යම් වැටුප් වැඩිවීමක් නො ලැබිය යුතුයි:

එසේ වුවද, මේ ඡේදයේ ඉහත සඳහන් විධිවිධාන යුද්ධ හමුදාධිපති විසින් ප්‍රමාණවත් යයි සලකනු ලබන රාජ්‍ය භාෂාව පිළිබඳ සුදුසුකම් ලබා තිබීමේ හේතුවෙන් එකී ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කරන ලද නව ප්‍රවේශක නිලධාරියකු කෙරෙහි අදාල නොවිය යුතුය.

(4) මේ නියෝගයේ—

"ආදි ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියා" යනුවෙන්—

(i) 1956 සැප්තැම්බර් 24 වැනිදට පෙර, යුද්ධ හමුදවේ ස්ථිර බලකායේ අධිකාරිය ලත් යම් වෛද්‍ය හෝ දන්ත නිලධාරියෙක් අදහස් වෙයි.

(ii) 1956 සැප්තැම්බර් 24 වැනි දින හෝ ඊට පසු යුද්ධ හමුදාවේ ස්ථිර බලකායේ අධිකාරි ලත් කිසියම් වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියකු එම දිනට ප්‍රථමයෙන් නාවික හමුදාවේ නිත්‍ය බල සේනාවේ, නිත්‍ය ගුවන් හමුදාවේ, ත්‍රිවිධ සේවාවන්ගේ ඕනෑම ස්වේච්ඡා බලකායක හෝ රජයේ සේවයේ සාමාජිකයකුව සිට ඔහුගේ යුද්ධ හමුදාවේ ස්ථිර බලකායේ සේවය අවස්ථාවෝචිත පරිදි නාවික හමුදාවේ නිත්‍ය බල සේනාවෙහි, නිත්‍ය ගුවන් හමුදාවෙහි. ත්‍රිවිධ සේවාවන්ගේ ඕනෑම ස්වේච්ඡා බලකායක හෝ රජයේ සේවායෙහි සේවය සමග අවිච්ඡින්න වූයේ නම්, එවැනි කිසියම් නිලධාරියෙක් අදහස් වෙයි.

"නව ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියෙක්" යන්නෙන් ආදි ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියකු නොවන වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියෙක් අදහස් වෙයි ; තවද

"ස්ථිර ලේකම්" යනුවෙන් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් අදහස් වෙයි.".

**සැළකිය යුතුයි : අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකළ සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගය සේ සැළකිය යුතුයි.**

---

එල්. ඩී.—බී. 126/50. අංකය : ඩී. 270/2/ආර්ජීසීපී.

## නාවික හමුදා පනත

1962 අංක 11 දරන පනතින් සංශෝධිත (358 වන අධිකාරය වන) නාවික හමුදා පනතේ 161 වන වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලබන නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් 16 වන දින,
කොළඹ දීය.

### නියෝගය

1961 සැප්තැම්බ මස 25 දින අංක 12,673 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබ, වරින්වර සංශෝධනය කරන ලද 1961 නාවික හමුදා වෛද්‍ය හා දන්ත වෛද්‍ය නිලධාරීන් පිළිබඳ නියෝග, එහි 10 වැනි නියෝගයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන්, තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"10අ. (1) මේ නියෝගවල විරුද්ධව කුමක් සඳහන් වුවද මෙහි මින්මතු විධිවිධාන යොදා ඇති ආකාරයට යටත්ව, ආදි ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියකු විසින්, 1966 සැප්තැම්බර් මස 4 වැනි දින අංක 700 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව රාජ්‍ය භාෂාවෙන් කටයුතු කිරීමට තමා අපොහොසත ය යන කරුණ හේතුකොටගෙන, විශ්‍රාම ගැනීමට තීරණය කළ හැකිය.

එසේ වුවද, යම් නිලධාරියකු සේවයේ රඳවා ගැනීම නාවික හමුදාවේ ප්‍රයෝජනය පිණිස අත්‍යවශ්‍ය යයි අග්‍රාණ්ඩුකාරවරයාගේ මතය නම්, ස්ථිර ලේකම් විසින් එකී නිලධාරියාගේ විශ්‍රාම ගැනීම ප්‍රතික්ෂෙප කළ හැකිය.

(2) 1966 සැප්තැම්බර් මස 4 දින අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, නාවික හමුදාවේ සියලුම නව ප්‍රවේශක වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් කෙරෙහි අදාල විය යුතුය.

(3) ස්ථිර ලේකම්ගේ එකඟත්වය ඇතිව, නාවික හමුදාධිපති විසින් නිශ්චය කරන ලද කාලසීමාවක් තුළදී රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් නොවූ කිසිම නව ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියකුට ඔහුගේ නිලයට නියමිත යම් වැටුප් වැඩිවීමක් නොලැබිය යුතුයි :

එසේ වුවද. මේ ඡේදයේ ඉහත සඳහන් විධිවිධාන නාවික හමුදාධිපති විසින් ප්‍රමාණවත් යයි සලකනු ලබන රාජ්‍ය භාෂාව පිළිබඳ සුදුසුකම් ලබා තිබීමේ හේතුවෙන් එකී ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කරන ලද නව ප්‍රවේශක නිලධාරියකු කෙරෙහි අදාල නොවිය යුතුය.

(4) මේ නියෝගයේ—

"ආදි ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියා" යනුවෙන්—

(i) 1956 සැප්තැම්බර් 24 වැනිදට පෙර, ස්ථිර නාවික බල හමුදාවේ අධිකාරිය ලත් යම් වෛද්‍ය හෝ දන්ත නිලධාරියෙක් අදහස් වෙයි.

(ii) 1956 සැප්තැම්බර් 24 වැනි දින හෝ ඊට පසු ස්ථිර නාවික බල හමුදාවේ අධිකාරි ලත් කිසියම් වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියකු එම දිනට ප්‍රථමයෙන් යුද්ධ හමුදාවේ නිත්‍ය බල සේනාවේ, නිත්‍ය ගුවන් හමුදාවේ, ත්‍රිවිධ සේවාවන්ගේ ඕනෑම ස්වේච්ඡා බලකායක හෝ රජයේ සේවයේ සාමාජිකයකුව සිට ඔහුගේ ස්ථිර නාවික බල හමුදාවේ සේවය අවස්ථාවෝචිත පරිදි යුද්ධ හමුදාවේ නිත්‍ය බල සේනාවෙහි, නිත්‍ය ගුවන් හමුදාවෙහි, ත්‍රිවිධ සේවාවන්ගේ ඕනෑම ස්වේච්ඡා බලකායක හෝ රජයේ සේවයෙහි සේවය සමග අවිච්ඡින්න වූයේ නම්, එවැනි කිසියම් නිලධාරියෙක් අදහස් වෙයි.

"නව ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියෙක්" යන්නෙන් ආදි ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියකු නොවන වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධායෙක් අදහස් වෙයි ; තවද

"ස්ථිර ලේකම්" යනුවෙන් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් අදහස් වෙයි.".

**සැළකිය යුතුයි : අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකළ සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගය සේ සැළකිය යුතුයි.**

---

එල්.ඩී.—බී. 130/50. අංකය : ඩී. 270/2/ආර්ජීසීපී.

## ගුවන් හමුදා පනත

(359 වැනි අධිකාරය වන) ගුවන් හමුදා පනතේ 155 වැනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් 16 වන දින,
කොළඹ දීය.

### නියෝගය

1961 සැප්තැම්බර් මස 25 දින අංක 12,673 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබ, වරින්වර සංශෝධනය කරන ලද 1961 ගුවන් හමුදා වෛද්‍ය හා දන්ත වෛද්‍ය නිලධාරීන් පිළිබඳ නියෝග, එහි 10 වැනි නියෝගයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන්, තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"10අ. (1) මේ නියෝගවල විරුද්ධව කුමක් සඳහන් වුවද මෙහි මින්මතු විධිවිධාන යොදා ඇති ආකාරයට යටත්ව, ගුවන් හමුදාවේ යම් ආදි ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියකු විසින්, 1966 සැප්තැම්බර් මස 4 වැනි දින අංක 700 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව රාජ්‍ය භාෂාවෙන් කටයුතු කිරීමට තමා අපොහොසත් ය යන කරුණ හේතුකොටගෙන, විශ්‍රාම ගැනීමට තීරණය කළ හැකිය :

එසේ වුවද. යම් නිලධාරියකු සේවයේ රඳවා ගැනීම ගුවන් හමුදාවේ ප්‍රයෝජනය පිණිස අත්‍යවශ්‍ය යයි අග්‍රාණ්ඩුකාරවරයාගේ මතය නම්, ස්ථිර ලේකම් විසින් එකී නිලධාරියාගේ විශ්‍රාම ගැනීම ප්‍රතික්ෂෙප කළ හැකිය.

(2) 1966 සැප්තැම්බර් මස 4 දින අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ගුවන් හමුදාවේ සියලුම නව ප්‍රවේශක වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් කෙරෙහි අදාල විය යුතුය.

(3) ස්ථිර ලේකම්ගේ එකඟත්වය ඇතිව. යුද්ධ හමුදාධිපති විසින් නිශ්චය කරන ලද කාලසීමාවක් තුළදී රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් නොවූ කිසිම නව ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියකුට ඔහුගේ නිලයට නියමිත යම් වැටුප් වැඩිවීමක් නොලැබිය යුතුයි :

එසේ වුවද, මේ ඡේදයේ ඉහත සඳහන් විධිවිධාන ගුවන් හමුදාපති විසින් ප්‍රමාණවත් යයි සලකනු ලබන රාජ්‍ය භාෂාව පිළිබඳ සුදුසුකම් ලබා තිබීමේ හේතුවෙන් එකී ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කරන ලද නව ප්‍රවේශක නිලධාරියකු කෙරෙහි අදාල නොවිය යුතුය.

(1) එම නියෝගයේ—

"ආදි ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියා" යනුවෙන්—

(i) 1956 සැප්තැම්බර් 24 වැනිදට පෙර, ස්ථිර ගුවන් හමුදාවේ අධිකාරිය ලත් යම් වෛද්‍ය හෝ දන්ත නිලධාරියෙක් අදහස් වෙයි.

(ii) 1956 සැප්තැම්බර් මස 24 වැනි දින හෝ ඊට පසු ස්ථිර ගුවන් හමුදාවේ අධිකාරි ලත් කිසියම් වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියකු එම දිනට ප්‍රථමයෙන් යුද්ධ හමුදාවේ නිත්‍ය බල සේනාවේ, නිත්‍ය නාවික හමුදාවේ, ත්‍රිවිධ සේවාවන්ගේ ඕනෑම ස්වේච්ඡා බලකායක හෝ රජයේ සේවයේ සාමාජිකයකුව සිට ඔහුගේ ස්ථිර ගුවන් හමුදාවේ සේවය අවස්ථාවෝචිත පරිදි යුද්ධ හමුදාවේ නිත්‍ය බල සේනාවෙහි, නිත්‍ය නාවික හමුදාවෙහි, ත්‍රිවිධ සේවාවන්ගේ ඕනෑම ස්වේච්ඡා බල කායක හෝ රජයේ සේවයෙහි සේවය සමග අවිච්ඡින්න වූයේ නම්, එවැනි කිසියම් නිලධාරියෙක් අදහස් වෙයි.

"නව ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියෙක්" යන්නෙන් ආදි ප්‍රවේශක වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියකු නොවන වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය නිලධාරියෙක් අදහස් වෙයි; තවද

"ස්ථිර ලේකම්" යනුවෙන් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් අදහස් වෙයි.".

**සැළකිය යුතුයි: අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකළ සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගය සේ සැළකිය යුතුයි.**

---

ඇල්.ඩී.බී. 91/49 අංකය : ඩී. 122/පීඊඑන්.

## යුද්ධ හමුදා පනත

(357 වැනි අධිකාරය වන) යුද්ධ හමුදා පනතෙහි 29 වැනි සහ 155 වැනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවනු ලැබූ නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් මස 15 දින,
කොළඹ දීය.

### නියෝගය

1961 සැප්තැම්බර් 28 වැනි දින අංක 12,680 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබ වරින් වර සංශෝධිත 1961 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය, මෙහි පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙසින් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 18 වැනි නියෝගයෙහි (1) වැනි ඡේදයෙහි (ඒ) අනුඡේදය යට ඉක්බිතිවම, පහත දැක්වෙන අළුත් අනුඡේදය ඇතුලත් කිරීමෙන් :—

"(ඔ) රජය යටතේ දෛනික වැටුප් හෝ තාවකාලික මාසික වැටුප් හෝ ලබන සේවකයකු වශයෙන් හෝ ස්ථිර විශ්‍රාම වැටුප් රහිත මාසික වැටුප් ලබන සේවකයෙකු වශයෙන් ඇති සේවය හෝ රජය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක පූර්ණ කාලීන වැඩ බැලීමේ සේවය :

එසේ වුවද, එබඳු යම් සේවයක් නිම කර ඇත්තේ විෂමාචාරය නිසා නම්, එසේ නිම කිරීමට කලින් තිබූ සේවා කාලය හෝ සේවා කාලයන් මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික දීමනා ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා ගණන් නොගත යුතු ය.

තවද, එසේ වුවත්, එබඳු සේවය විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික දීමනා සඳහා ගණන් ගැනීමට නම් (434 වැනි අධිකාරය වන) රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥා පනතේ 14 වැනි වගන්තිය යටතේ රජය විසින් සේවකයාගේ ගිණුමට බැර කිරීම සඳහා ගෙවා ඇති කිසියම් ප්‍රසාද මුදලක් හෝ ප්‍රදානයක් හෝ වෙනයම් ප්‍රතිලාභයක් වේ නම්, එය ලැබූ දින සිට, වර්ෂයකට සියයට හතර බැගින් වන සුළු පොළියක් ද සමග එම මුදල සේවකයා විසින් ආපසු ගෙවීම කොන්දේසියක් විය යුතු යි.

(2) එහි 26 වැනි නියෝගයෙහි (1) වැනි ඡේදයෙහි—

(අ) එහි අතුරු විධානයෙහි "සමස්තය වශයෙන් අවුරුදු දෙකකට නොඅඩු." යන යෙදුම වෙනුවට "සමස්තය වශයෙන් අවුරුදු දෙකකට නොඅඩු :" යන යෙදුම ආදේශ කිරීමෙන් ; හා

(ආ) එහි අතුරු විධානයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් අතුරු විධානය ඇතුලත් කිරීමෙන් ;

"තවද, එසේ වුවත්, විශ්‍රාම යෑමට අවුරුදු දෙකක් ඇතුලතදී සෙබළෙකුගේ ස්ථිර හෝ තාවකාලික නිලය පහත හෙළනු ලැබ, එය කලින් තිබූ තත්වයටම නැවත පමුණුවා නැත්නම්, විශ්‍රාම වැටුප් පිළිබඳ කාර්‍යයන් සඳහා ගණන් ගන්නා නිලය විය යුත්තේ විශ්‍රාම ගන්නා දිනයෙහි ඔහු දැරූ ස්ථිර හෝ තාවකාලික හෝ ඉහලම නිලය වේ."

(3) එහි 32 නියෝගයෙහි (1) වැනි ඡේදයෙහි (එ) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුලත් කිරීමෙන් :—

"(ඒ) රජය යටතේ දෛනික වැටුප් හෝ තාවකාලික මාසික වැටුප් හෝ ලබන සේවකයකු වශයෙන් හෝ ස්ථිර විශ්‍රාම වැටුප් රහිත මාසික වැටුප් ලබන සේවකයෙකු වශයෙන් හෝ රජය යටතේ විශ්‍රාම සහිත තනතුරක පූර්ණ කාලීන වැඩ බැලීමේ සේවය :

එසේ වුවද, එබඳු යම් සේවා කාලයක් නිම කර ඇත්තේ විෂමාචාරය නිසා නම්, එසේ නිම කිරීමට කලින් තිබූ සේවා කාලය හෝ සේවා කාලයන් මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික දීමනා ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා ගණන් නොගත යුතුය.

තවද, එසේ වුවත්, එබඳු සේවයක් විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික දීමනා සඳහා ගණන් ගැනීමට නම්, (434 වැනි අධිකාරය වන) රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනතේ 14 වැනි වගන්තිය යටතේ සේවකයාගේ ගිණුමට බැර කිරීම සඳහා ගෙවා ඇති කිසියම් ප්‍රසාද මුදලක් හෝ ප්‍රදානයක් හෝ වෙනයම් වාසියක් වේ නම්, ඒය ලැබුන දින සිට වර්ෂයකට සියයට හතර බැගින් වන සුළු පොලියක් ද සමග එම මුදල සේවකයා විසින් ආපසු ගෙවීම කොන්දේසියක් විය යුතු යි."

**සැළකිය යුතුයි: අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකළ සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගය සේ සැළකිය යුතුයි.**

---

ඇල්.ඩී—බී. 126/50 අංකය : ඩී. 122/පීඊඑන්.

## නාවික හමුදා පනත

(358 වැනි අධිකාරය වන) නාවික හමුදා පනතේ 161 වැනි වගන්තිය යටතේ, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් පනවනු ලැබූ නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් මස 15 දින,
කොළඹ දීය.

### නියෝගය

1962 දෙසැම්බර් 7 වැනි දින අංක 13,423 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ වරින් වර සංශෝධිත 1962 නාවික හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය පහත සඳහන් පරිදි තව දුරටත් මෙසින් සංශෝධනය කරනු ලැබේ.

(1) 16 වැනි නියෝගයෙහි (1) වැනි ඡේදයෙහි (එ) අනුඡේදයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඒ) රජය යටතේ දෛනික වැටුප් හෝ තාවකාලික මාසික වැටුප් ලබන සේවකයකු වශයෙන් හෝ ස්ථිර විශ්‍රාම වැටුප් රහිත මාසික වැටුප් ලබන සේවකයකු වශයෙන් හෝ රජය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක පූර්ණ කාලීන වැඩ බැලීමේ සේවය :

එසේ වුවද, එබඳු සේවයක් නිමකර ඇත්තේ විෂමාචාරය නිසා නම්, එසේ නිම කිරීමට කලින් නියෝග යටතේ විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික දීමනා ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා ගණන් නොගත යුතුය.

තවද, එසේ වුවත්, එවැනි සේවය විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික මුදල් සඳහා ගණන් ගැනීමට නම් (434 වැනි අධිකාරය වන) රාජ්‍ය සේව අර්ථ සාධක අරමුදල් ආඥාපනතේ 14 වැනි වගන්තිය යටතේ රජය විසින් සේවකයාගේ බැර ගිණුමට ගෙවනු ලැබූ යම් ප්‍රසාද මුදලක් හෝ ප්‍රදානයක් හෝ වෙනත් ප්‍රතිලාභයක් වේතොත්, එම මුදල ලබු දින සිට වර්ෂයකට සියයට හතර බැගින් වන සුළු පොලියක් ද සමග එම මුදල සේවකයා විසින් ආපසු ගෙවීම කොන්දේසියක් විය යුතු සි."

(2) එහි 24 වැනි නියෝගයෙහි (1) වැනි ඡේදයෙහි :—

(අ) එහි අතුරු විධානයෙහි "සමස්ත වශයෙන් අවුරුදු දෙකකට නොඅඩු." යන යෙදුම වෙනුවට "සමස්තය වශයෙන් අවුරුදු දෙකකට නොඅඩු" යන යෙදුම ආදේශ කිරීමෙන් ; හා

(ආ) එහි අතුරු විධානයට ඉක්බිතිවම, පහත සඳහන් අලුත් අතුරු විධානය ඇතුලත් කිරීමෙන් :—

"තවද, නැවියෙකුගේ ස්ථිර හෝ තාවකාලික නිල තත්ත්වය විශ්‍රාම ගැනීමට අවුරුදු 2ක් ඇතුලත පහත හෙළනු ලැබ එම නිල තත්ත්වයේ නැවත පිහිටුවා නොමැති නම් විශ්‍රාම වැටුප් පරමාර්ථය උදෙසා ගණන් ගනු ලබන ඔහුගේ නිල තත්ත්වය වන්නේ විශ්‍රාම යාමේදී ඔහු විසින් දරන ලද ස්ථිර හෝ තාවකාලික හෝ උසස්ම නිලය විය යුතුය."

(3) එහි 30 නියෝගයේ (1) වැනි ඡේදයේ (ඌ) අනුඡේදයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් අනුඡේදය ඇතුලත් කිරීමෙන් :—

"(එ) රජය යටතේ දෛනික වැටුප් හෝ තාවකාලික මාසික වැටුප් හෝ ලබන සේවකයකු වශයෙන් හෝ සථිර විශ්‍රාම වැටුප් රහිත මාසික වැටුප් ලබන සේවකයකු වශයෙන් හෝ රජය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක පූර්ණ කාලීන වැඩ බැලීමේ සේවය :

එසේ වුවද, එබඳු යම් සේවා කාලයක් නිම කර ඇත්තේ විෂම චාරය නිසා නම්, එසේ නිම කිරීමට කලින් තිබූ සේවා කාලය හෝ සේවා කාලයන් මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික දීමනා ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා ගණන් නොගත යුතු ය.

තවද, එසේ වුවත්, එවැනි සේවය විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික දීමනා සඳහා ගණන් ගැනීමට නම් (434 වැනි අධිකාරය වන) රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනතේ 14 වැනි වගන්තිය යටතේ රජය විසින් සේවකයාගේ බැර ගිණුමට ගෙවනු ලැබූ ප්‍රසාද මුදලක් හෝ ප්‍රදානයක් හෝ වෙනත් ප්‍රතිලාභයක් වෙතොත් එම මුදල ලැබූ දින සිට වර්ෂයකට සියයට හතර බැගින් වන සුළු පොලියක් සමඟ එම මුදල සේවකයා විසින් ආපසු ගෙවීම කොන්දේසියක් විය යුතු ය."

**සැළකිය යුතුයි : අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකල සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගය සේ සැළකිය යුතුයි.**

ඇල්.ඩී.බී. 130/50

අංකය : ඩී. 122/පීඊඑන්

## ගුවන් හමුදා පනත

(359 වැනි අධිකාරය වන) ගුවන් හමුදා පනතෙහි 29 වැනි සහ 155 වැනි වගන්ති යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් මස 15 දින,
කොළඹ දීය.

### නියෝගය

1962 සැප්තැම්බර් මස 14 වෙනි දින අංක 13,301 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර, වරින් වර සංශෝධනය කරනු ලැබූ, 1962 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික දීමනා සංග්‍රහය පහත සඳහන් පරිදි තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 16 වැනි නියෝගයෙහි (1) වැනි ඡේදයෙහි (ඒ) අනුඡේදයට ඉක්බිතිව, පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුලත් කිරීමෙන් :—

"(ඔ) රජය යටතේ දෛනික වැටුප් හෝ තාවකාලික මාසික වැටුප් හෝ ලබන සේවකයකු වශයෙන් හෝ ස්ථිර විශ්‍රාම වැටුප් රහිත මාසික වැටුප් ලබන සේවකයකු වශයෙන් හෝ රජය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක පූර්ණ කාලීන වැඩ බැලීමේ සේවය :

එසේ වුවද, එබඳු යම් සේවයක් නිමකර ඇත්තේ විෂම චාරය නිසා නම්, එසේ නිම කිරීමට කලින් තිබූ සේවා කාලය හෝ සේවා කාලයන් මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික දීමනා ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා ගණන් නොගත යුතුය.

තවද, එසේ වුවත්, එබඳු සේවය විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික දීමනා සඳහා, ගණන් ගැනීමට නම් (434 වැනි අධිකාරය වන) රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනතේ 14 වැනි වගන්තිය යටතේ සේවකයාගේ ගිණුමට බැර කිරීම සඳහා ගෙවා ඇති කිසියම් ප්‍රසාද මුදලක් හෝ ප්‍රදානයක් හෝ වෙන යම් ප්‍රතිලාභයක් වේ නම්, එය ලැබූ දින සිට වර්ෂයකට සියයට හතර බැගින් වන සුළු පොලියක් ද සමග එම මුදල සේවකයා විසින් ආපසු ගෙවීම කොන්දේසියක් විය යුතු සි."

(2) එහි 24 වැනි නියෝගයෙහි (1) වැනි ඡේදයෙහි—

(අ) එහි අතුරු විධානයෙහි "සමස්තය වශයෙන් අවුරුදු දෙකකට නොඅඩු." යන යෙදුම වෙනුවට "සමස්තය වශයෙන් අවුරුදු දෙකකට නොඅඩු :" යන යෙදුම ආදේශ කිරීමෙන් ; හා

(ආ) එහි අතුරු විධානයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් අතුරු විධානය ඇතුළත් කිරීමෙන් :—

"තවද, එසේ වුවත්, විශ්‍රාම යෑමට අවුරුදු දෙකක් ඇතුළතදී ගුවන් භටයකුගේ ස්ථිර හෝ තාවකාලික නිලය පහත හෙලනු ලැබ, එය කලින් තිබූ තත්ත්වයට නැවත පමුණුවා නැතිනම්, විශ්‍රාම වැටුප් පිළිබඳ කාර්යයන් සඳහා ගණන් ගන්නා නිලය විය යුත්තේ විශ්‍රාම ගන්නා දිනයෙහි ඔහු දැරූ ස්ථිර හෝ තාවකාලික හෝ ඉහළම නිලය වේ."

(3) එහි 30 නියෝගයේ (1) වැනි ඡේදයේ (එ) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

(ඒ) රජය යටතේ දෛනික වැටුප් හෝ තාවකාලික මාසික වැටුප් හෝ ලබන සේවකයකු වශයෙන් හෝ සථිර විශ්‍රම වැටුප් රහිත මාසික වැටුප් ලබන සේවකයකු වශයෙන් හෝ රජය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක ලබා ඇති පූර්ණ කාලීන වැඩ බැලීමේ සේවය :

එසේ වුවද, එබඳු යම් සේවා කාලයක් නිම කර ඇත්තේ විෂම චාරය නිසා නම්, එසේ නිම කිරීමට කලින් තිබූ සේවා කාලය හෝ සේවා කාලයන් මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික දීමනා ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා ගණන් නොගත යුතු ය.

තවද, එසේ වුවත්, එබඳු සේවය විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික දීමනා සඳහා ගණන් ගැනීමට නම් (434 වැනි අධිකාරය වන) රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනතේ 14 වැනි වගන්තිය යටතේ සේවකයාගේ ගිණුමට බැර කිරීම සඳහා ගෙවා ඇති කිසියම් ප්‍රසාද මුදලක් හෝ ප්‍රදානයක් හෝ වෙනත් යම් වාසියක් වේ නම්, එය ලැබුණ දින සිට වර්ෂයකට සියයට හතර බැගින් වන සුළු පොලියක් සමඟ එම මුදල සේවකයා විසින් ආපසු ගෙවීම කොන්දේසියක් විය යුතු යි."

**සැළකිය යුතුයි: අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකල සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගය සේ සැළකිය යුතුයි.**

---

එල්.ඩී.—බී. 91/49. අංකය : ඩී. 472/ඊපී.

## යුද්ධ හමුදා පනත

(357 වැනි අධිකාරය වන) යුද්ධ හමුදා පනතේ 24 වැනි හා 155 වැනි වගන්ති යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 ඔක්තෝබර් මස 15 දින,
කොළඹ දීය.

**නියෝගය**

1961 අප්‍රේල් 28 වැනි දින අංක 12,395 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ කලින් කල සංශෝධිත, 1961 යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය පහත සඳහන් පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 15 වැනි නියෝගයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් නියෝගය ඇතුළු කිරීමෙන් :—

"වෙනත් දීමනා

15අ. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විමසා, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණ අනුව වෙනත් යම් දීමනාවක් නිලධාරියකුහට ගෙවිය යුතු ය";

(2) එහි 20 වැනි නියෝගයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් නියෝග ඇතුළු කිරීමෙන් :—

නියෝග ඇතුළු කිරීමෙන් :—

20 අ. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විමසා, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණ අනුව වෙනත් යම් දීමනාවන් ආධුනිකයකුහට ගෙවිය යුතු ය.

බැට්මන් දීමනාව

20 ආ. බැට්මන් සේවය සැපයීම සඳහා ආධුනිකයකු ලංකාවෙහි පුහුණුව ලබද්දී ඔහු ස්ථිරව පදිංචිව සිටින නේවාසිකාගාරයට මසකට රුපියල් පනහක් ගෙවිය යුතුය."; තවද

(3) එහි 38 වැනි නියෝගයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් නියෝගය ඇතුළු කිරීමෙන් :—

"වෙනත් දීමනා

38 අ. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විමසා, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණ අනුව වෙනත් යම් දීමනාවන් යුද්ධ භටයකුහට ගෙවිය යුතුය."

**සැළකිය යුතුයි: අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකල සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගයසේ සැළකිය යුතුයි.**

---

එල්.ඩී.—බී. 126/50. අංකය : ඩී. 472/ඊපී.

## නාවික හමුදා පනත

(358 වැනි අධිකාරය වන) නාවික හමුදා පනතේ 161 වැනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු ඇමති.

1969 ඔක්තෝබර් 15 දින,
කොළඹ දී ය.

**නියෝගය**

1961 අප්‍රේල් 28 වැනි දින අංක 12,395 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ කලින් සංශෝධිත, 1961 නාවික හමුදා වැටුප් සංග්‍රහය පහත සඳහන් පරිදි තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) 17 වැනි නියෝගයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් නියෝගය ඇතුළු කිරීමෙන් :—

"වෙනත් දීමනා

17 අ. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විමසා, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණ අනුව වෙනත් යම් දීමනාවන් නිලධාරියකුට ගෙවිය යුතු ය.

(2) 23 වැනි නියෝගයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් නියෝගය ඇතුළු කිරීමෙන් :—

"වෙනත් දීමනා

23 අ. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විමසා, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණ අනුව වෙනත් යම් දීමනාවන් ආධුනිකයකුට හෝ මිඩ්ෂිප්මන්වරයකුට ගෙවිය යුතුය.";

(3) 40 වැනි නියෝගයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් නියෝගය ඇතුළු කිරීමෙන් :—

"වෙනත් දීමනා

40 අ. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විමසා, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණ අනුව වෙනත් යම් දීමනාවන් නාවිකයකුට ගෙවිය යුතුය.".

**සැළකිය යුතුයි: අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකල සේ සැළකිය යුතුයි. අංක 14,891 දරණ 70. 1. 29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගය සේ සැළකිය යුතුයි.**

---

එල්.ඩී.—බී. 130/50. අංකය : ඩී. 472/ඊපී.

## ගුවන් හමුදා පනත

(359 වැනි අධිකාරය වන) ගුවන් හමුදා පනතේ 24 වැනි හා 155 වැනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු ඇමති.

1969 ඔක්තෝබර් 15 දින,
කොළඹදී ය.

**නියෝගය**

1961 අප්‍රේල් 28 වන දින අංක 12,395 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ කලින් කල සංශෝධිත, 1961 ගුවන් හමුදා වැටුප් සංග්‍රහය පහත සඳහන් පරිදි තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) 16 වැනි නියෝගයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් නියෝගය ඇතුළු කිරීමෙන් :—

"වෙනත් දීමනා

16 අ. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විමසා, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණ අනුව වෙනත් යම් දීමනාවන් නිලධාරියෙකුට ගෙවිය යුතු ය.";

(2) 22 වැනි නියෝගයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් නියෝග ඇතුළු කිරීමෙන් :—

"වෙනත් දීමනා

22අ. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විමසා, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණ අනුව වෙනත් යම් දීමනාවන් ආධුනිකයකුහට ගෙවිය යුතුය.";

බැට්මන් දීමනාව

22 ආ. බැට්මන් සේවය සැපයීම සඳහා ආධුනිකයකු ලංකාවෙහි පුහුණුව ලබද්දී ඔහු ස්ථිරව පදිංචිව සිටින නේවාසිකාගාරයට මසකට රුපියල් පනහක් ගෙවිය යුතුය.";

(3) 37 වැනි නියෝගයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් නියෝගය ඇතුළු කිරීමෙන් :—

"වෙනත් දීමනා

37 අ. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විමසා, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණ අනුව වෙනත් යම් දීමනාවන් ගුවන් භටයෙකුට ගෙවිය යුතු ය."; තවද

(4) 41 වැනි නියෝගයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් නියෝගය ඇතුළු කිරීමෙන් :—

"වෙනත් දීමනා

41 අ. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විමසා, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණ අනුව වෙනත් යම් දීමනාවන් පුහුණුව ලබන්නෙකුට ගෙවිය යුතු ය.".

**සැලකිය යුතුයි: අංක 14,877 දරණ 69.10.24 දින ගැසට් පත්‍රයේ පළවූ නියෝගය මුද්‍රණ දෝෂ ඇති හෙයින් අවලංගුකල සේ සැලකිය යුතුයි. අංක 14,891 දරණ 70.1.29 දින ගැසට් පත්‍රයේ නැවත පළකර ඇති මෙම නියෝගය නිවැරදි නියෝගයසේ සැලකිය යුතුයි.**

---

ඊඩී 01/12/019

එල්. ඩී.—බී. 7/63

## 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත

### 6(1)(V) වන වගන්තිය යටතේවූ ආඥාව

1968 අංක 26 දරන පනතින් සංශෝධිත 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 6(1)(V) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමති, උක්කු බණ්ඩා වන්නිනායක වන මම, එම්. අයි. එම්. හලීම් විසින් දේශ සංචාරකයින් සඳහා වැල්ලවත්තේ හෝටලයක් පවත්වාගෙන යාම අරමුණු කොටගත් ව්‍යාපාරයක් වූ "වැල්ලවත්තේ සැෆයර් හොටේල්" නමැති ආයතනයට ඉහත සඳහන් වගන්තිය අදාළ විය යුතු යැයි 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලයේ ඉල්ලීම අනුව මේ ආඥාව මගින් ප්‍රකාශ කරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1970 ජනවාරි මස 12 වන දින,
කොළඹ දීය.

1-697

...

---

## 1957 අංක 22 දරන බදු සංචිත සහතිකපත් ආඥාපනත

### 2(1) වැනි වගන්තිය යටතේ හත් වැනි ආඥාව

1961 අංක 18 සහ 51 දරන පනත් වලින් සංශෝධිත 1957, අංක 22 දරන බදු සංචිත සහතික පත් ආඥාපනතේ 2(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති උක්කු බණ්ඩා වන්නිනායක වන මම, මේ ආඥාවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කළ හැකි, බදු සංචිත සහතික පත්හි ප්‍රමාණය රුපියල් පන් කෝටියක් බවද, එම සහතික පත්, රුපියල් සියයේ හෝ සියයේ ගුණිතයන් සඳහා නිකුත් කරන ලෙස ද මෙයින් නියම කරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1970 ජනවාරි 13 වැනි දින,
කොළඹ දී ය.

1-692

---

## නොතාරිස් ආඥාපනත

### දැන්වීමයි

මෙහි උපලේඛනයෙහි දක්වා ඇති ආඥාව ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවා ඇති බව (107 වන අධිකාරය වන) නොතාරිස් ආඥාපනතෙහි 25 (2) වන වගන්තිය අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
ස්ථිර ලේකම්,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1970 ජනවාරි මස 18 දින,
කොළඹ දීය.

1-824/1

## උපලේඛනය

### නොතාරිස් ආඥාපනත

(107 වන අධිකාරය වන) නොතාරිස් ආඥාපනතේ 25 (1) වන වගන්තිය යටතේ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලබන ආඥාවයි.

ඩී. දහනායක,
ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1970 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

කොළඹ අධිකරණ කොට්ඨාශය තුළ ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන් ගෙන් නොතාරිස් ධූරයේ කටයුතු කිරීමට ඔලිවර් නිවටන් වඳුරාගල මහතාට නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම මෙයින් නිෂ්ප්‍රභා කරනු ලැබේ.

1-824/2

---

## රබර් පර්යේෂණ ආඥාපනත

### 9 බී වගන්තිය යටතේ නියෝගය

1957 අංක 8 දරණ පනතින් සංශෝධිත රබර් පර්යේෂණ ආඥාපනතේ 9 බී වගන්තිය වශයෙන් ක්‍රියාත්මක වන, 1959 අංක 2 දරණ තේ, රබර් සහ පොල් (සංශෝධන) පනතේ 3 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කාෂිකම් හා ආහාර ඇමති, මොහොට්ටාල්ලාගේ සිංගිරි බණ්ඩා වන මම රබර් පර්යේෂණ ආයතනයේ සේවකයන් සඳහා නිවාස හා වෙනත් පහසුකම් සැලසීමේ කාර්යය සඳහා රබර් පර්යේෂණ ආඥාපනතේ 2 වැනි වගන්තියෙන් ස්ථාපිත රබර් පර්යේෂණ මණ්ඩලයට අවශ්‍ය වූ, මීට සංකොට ඇති උප ලේඛනයේ නිශ්චිතව සඳහන් නිශ්චල දේපල අත්කර ගැනීමට කර ඇති යෝජනාව මේ ආඥාවෙන් අනුමත කරමි.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ආහාර ඇමති.

කොළඹ, 1970 ජනවාරි මස 17 දින දීය.

## උප ලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත නැගෙනහිර පස්දුන් කෝරළයේ ප්‍රදේශීය ආදායම් පාලක හා පින්නගොඩ ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් මූලටියන ග්‍රාමයෙහි පිහිටි හරන්කලියාපොත්ත වත්ත නමින් හැඳින්වෙන අක්කර 5, රූඩ් 0, පර්චස් 07 ක් පමණ වන, පහත සඳහන් මායිම්වලට අයත් ඉඩම :—

උතුරට : ගලේවත්ත වත්ත ;

නැගෙනහිරට : ගලේවත්ත වත්ත ;

දකුණට : ඇල ;

බටහිරට : ඩී. එච්. හෙට්ටිආරච්චිගේ ඉඩම සහ පී. ජී. 244356.

1-736

---

ඇල්.ඩී.—බී. 60/34

## රේගු නිවේදනය අංක 3/69 දරන බැඳුම්කරය

### රේගු ආඥාපනත

(235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 69 වෙනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල අනුව, ප්‍රධාන රේගු අයකැමි, විජය පෙරේරා විට්ටාච්චි වන මම, ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය ඇතිව, ඔහුගේ නියමය පරිදි පළකරනු ලබන මේ නිවේදනයෙන්, කොළඹ, බෙයිලි පාරේ අංක 49/2 දරන ස්ථානයේ පිහිටි ගබඩාව සීමාසහිත මිලර්ස් මහතුන් විසින් ආනයනය කරනු ලබන චිත්‍රපටි සඳහා දළ සෝයා පටි ඒවායේ ප්‍රථම ආනයන බිල් සටහන වෙනුවෙන් තීරුගාස්තු නොගෙවා ගුදම් කිරීම, තැබීම හා ආරක්ෂාව සැලසීම කළ හැකි ගුදමක් වශයෙන් නියම කරමින් එකී වගන්තිය යටතේ සම්පාදිතව 1965 ජූනි මස 11 දින අංක 14,421 දරන ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනය මෙයින් අවලංගු කරමි.

ඩබ්ලිව්. පී. විට්ටාච්චි,
ප්‍රධාන රේගු අයකැමි.

1970 ජනවාරි මස 10 වන දින,
කොළඹ දී ය.

1-838

අංකය : ඊඩී 26/010

## කෘෂිකර්ම හා කර්මාන්ත ණයදෙන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය

කෘෂිකර්ම හා කර්මාන්ත ණයදෙන ආයතන ආඥාපනතේ 7(2) හා 14 වැනි වගන්ති යටතේ ගරු මුදල් ඇමතිතුමා විසින් 1970 ජනවාරි මස 13 වෙනි දින සිට 1971 පෙබරවාරි මස 11 වෙනි දින දක්වා සී. ඒෆ්. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා කෘෂිකර්ම හා කර්මාන්ත ණයදෙන ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කරන්ට යෙදී ඇත.

එච්. ආර්. ද සොයිසා,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1970 ජනවාරි මස 17 දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ දී ය.

1—738

---

## නොතාරිස් ආඥා පනත (107 වන අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් ඔලිවර් නිව්ටන් වඳුරාගල මහතා එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
ස්ථිර ලේකම්,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1970 ක්වූ ජනවාරි මස 18 වැනි දින,
කොළඹ දීය.

1—825/2

---

## 1954 අංක 12 දරණ කිරි මණ්ඩල පනත

### නිවේදනය

1957 අංක 9 සහ 1955 අංක 28 දරණ පනත්වලින් සංශෝධිත පරිදි 1954 අංක 12 දරණ කිරි මණ්ඩල පනතේ 4(1) වැනි වගන්තිය යටතේ ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා විසින් පහත නම් සඳහන් අය එම නම් ඉදිරියේ දැක්වෙන කාල පරිච්ඡේදය සඳහා කිරි මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් පත්කර ඇති බැව් පොදු දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ :—

(1) ඇල්. ඇන්. ද ඇල්. බණ්ඩාරනායක මහතා 1969 ඔක්තෝබර් මස 6වෙනි දින සිට අවුරුදු 5ක කාලයක් සඳහා.

(2) ආචාර්ය ඇස්. ටී. සෙනෙවිරත්න මහතා 1969 දෙසැම්බර් මස 10 වෙනි දින සිට අවුරුදු 5ක කාලයක් සඳහා.

තවද ඇල්. ඇන්. ද ඇල්. බණ්ඩාරනායක මහතා 1969. 10. 6 දින සිට කිරි මණ්ඩලයේ සභාපති වශයෙන් ද පත්කර ඇත්තේ ය.

මේ අනුව කිරි මණ්ඩලයේ සම්පූර්ණ සංයුතිය පහත දැක්වෙන පරිදි වේ :—

ඇල්. ඇන්. ද ඇල්. බණ්ඩාරනායක මහතා. සභාපති.
ආචාර්ය ඒ. බණ්ඩාරනායක මහතා.
දොස්තර ජී. ඒ. ආර්. පෙරේරා මහතා.
ස්ටැන්ලි මොල්ලිගොඩ මහතා.
ඇස්. ද ඇස්. ජයරත්න මහතා.
ඇම්. ඇම්. සෙනෙවිරත්න මහතා.
ආචාර්ය ඇස්. ටී. සෙනෙවිරත්න මහතා.

බී. මහාදේව,
කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ජනවාරි මස 16 වැනි දින,
කොළඹ 2,
ගුණසිංහ පෙදෙසේ,
කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේදී ය.

1—776

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක. 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් මොහමඩ් හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම—

(අ) 1969 ජූනි 6 වැනි දින අංක 14,857 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 11 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ දොඩන්දූව සුළු නගර සහා ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත්කරමි :—

(1) දොඩන්දූව, "ග්‍රීන්වුඩ්" හි පදිංචි ගල්බොක්කෙ හේවාගේ විල්බට් ද සිල්වා මහතා.

(2) දොඩන්දූව, ශ්‍රී සරණ ජෝති මාවතෙහි පදිංචි පවුවිත විතානගේ අමරසේන මහතා.

(3) දොඩන්දූව, ශ්‍රී සරණ ජෝති මාවතෙහි පදිංචි බන්දුසෝම මානවඩු මහතා.

(4) දොඩන්දූව. වලමල්ල, "විජය" හි පදිංචි විජේසූරිය පටබැඳි මුහන්දිරම්ගේ පීටර් මහතා.

(5) දොඩන්දූව, ගොඩබැද්ද පාරේ අංක 69 හි පදිංචි, වින්සන් රූපසේ විජේසූරිය මහතා.

(6) දොඩන්දූව, මහවීදිය, අංක 291 හි පදිංචි, මැන්ඩිස් කළුපහන මහතා.

(7) දොඩන්දූව, "ගුණදාස ඖෂධාලය" හි ආයුර්වේද වෛද්‍ය, කාරියවසම් පටපවිත විදානගේ ගුණදාස මහතා.

(8) දොඩන්දූව. ගොඩබැද්ද පාරේ, "ජය නිවස" හි පදිංචි, පවුවිත විතානගේ දයාරත්න මහතා.

(9) දොඩන්දූව. දෙගල්ල පාර. "සෝමගිරි" හි පදිංචි, පස්හැන්නැදිගේ ඇඩ්වින් සිල්වා මහතා.

(10) දොඩන්දූව, "විජය මන්දිර" හි පදිංචි, ජස්ටින් විජේසූරිය මහතා.

(11) දොඩන්දූව. දෙගල්ල, "ප්‍රියාලය" හි පදිංචි, වඩුගේ සෝමරත්න මහතා.

(12) දොඩන්දූව, "රෝහිනී" හි පදිංචි, හෝනාපිනුවල විතානගේ පියදාස මහතා.

(13) දොඩන්දූව, රේගව පාරේ, පදිංචි, දික්වැල්ලෙ පටබැඳිගේ එඩ්වින් ගුණදාස මහතා.

(14) දොඩන්දූව, දෙගල්ල, "ටෙම්ස්මෝර්" හි පදිංචි, වඩුගේ බෙනට් සිල්වා මහතා.

(15) දොඩන්දූව. ගොඩබැද්ද. "ඉන්ද්‍රානී" හි පදිංචි, හික්කඩුව ලියනගේ විමලරත්න මහතා.

(16) දොඩන්දූව, උඩුගල්පිටිය, "තාරකා" හි පදිංචි, බර්නාඩ් වින්සන් ද අල්විස් මහතා.

(17) දොඩන්දූව. උඩුගල්පිටිය පදිංචි. නානායක්කාරවසම් අලිසන්දර විදානෙලාගේ මාටින් අල්විස් මහතා.

(18) දොඩන්දූව, ගොඩබැද්ද පදිංචි, ගොඑවා මරක්කලගේ සයිමන් සිල්වා මහතා.

(19) දොඩන්දූව, ගොඩබැද්ද පදිංචි, ගල්බොක්ක හේවාගේ විල්සන් ද සිල්වා මහතා.

(20) දොඩන්දූව, කෙලින් වීදිය, අංක 326 හි පදිංචි, කාරියවසම් ගම්හේවාගේ ලයනල් ද සිල්වා මහතා.

(21) දොඩන්දූව, දෙගල්ල පදිංචි, ගල්බොක්කෙ හේවාගේ ගුණපාල ද සිල්වා මහතා.

(22) දොඩන්දූව, මෝදර, "බ්‍රීජ්විව්" හි පදිංචි හේවාවසම් වැදිගේ පියසේන මහතා.

(23) දොඩන්දූව, ගොඩබැද්ද පාර, අංක 9 හි පදිංචි දොන් ආරොන් ද සිල්වා සමරසේකර මහතා.

(24) දොඩන්දූව. දෙගල්ල, "ජයන්ති" හි පදිංචි, ජයවීර පටබැඳිගේ ගුණසේන ද සිල්වා මහතා.

(25) දොඩන්දූව, "සුමනපාය" හි පදිංචි, කීර්තිරත්න වීරසිංහ මහතා.

(26) දොඩන්දූව, කුමාරකන්ද, අංක 107 හි පදිංචි, මාක්ස් හවඩ් ඩිවට් පෙරේරා කුරුකුලසූරිය මහතා.

(ආ) දොඩන්දූව, "ග්‍රීන්වුඩ්" හි පදිංචි, ගල්බොක්කෙ හේවාගේ විල්බට් ද සිල්වා මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

ඇම්. එච්. ඇම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

1—832

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයකි

1969 අගෝස්තු මස 10 වන දින සිට අවුරුදු තුනක කාලයක් තුළ චිත්‍රපටි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින් වශයෙන් පෙනී සිටීමට (136 වන අධිකරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු හා රැකීරක්ෂා කට යුතු පිළිබඳ ගරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත් තන් පත් කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවසාථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. පී. තම්බයියා,
කම්කරු හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්වරයා.

1970 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ දීය.

**නම නියමකොට පත් කරන සාමාජිකවරු :**

1. හෙන්රි ධර්මසේන මහතා
2. සරණගුප්ත අමරසිංහ මහතා
3. ඒ. රත්නම් මහතා

**සේව්‍ය නියෝජිත සාමාජිකවරු :**

1. ආර්. ඊ. වීරසේකර මහතා
2. කේ. විජේසිංහ මහතා
3. ඒ. ජේජ් මහතා
4. ආර්. ජී. වික්‍රමසිංහ මහතා
5. ටී. දේවරජන් මහතා
6. ඇම්. අමීර් ෂෙරීෆ් මහතා
7. ඒ. නවරත්නම් මහතා
8. හම්සා ඒ. කාදර් මහතා
9. ජබීර් ඒ. කාදර් මහතා
10. සී. වී. ද සිල්වා මහතා
11. ඇන්ටන් වැන් ස්ටාරෙක්ස් මහතා

**සේවක නියෝජිත සාමාජිකවරු :**

1. ආර්. ෂන්මුගදසන් මහතා
2. සී. ඩී. ගුණවර්ධන මහතා
3. ඇම්. ජී. මැන්ඩිස් මහතා
4. ඇම්. පී. රූපසේන මහතා
5. වෝල්ටර් ජෝතිපාල මහතා
6. ටී. ඒ. ජේ. අමරසේකර මහතා
7. ඩී. එච්. සමරසේන මහතා
8. ආස්. ඒ. පීරිස් මහතා
9. ඒ. ආර්. ඒ. කාදර් මහතා
10. ඇෆ්. ආර්. රාසයියා මහතා
11. ස්ටැන්ලි ද සිල්වා මහතා.

1—486

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 1), 3(8) හා 4(1) වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් මොහමඩ් හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම—

(අ) 1969 ජූනි මස 6 දින අංක 14,857 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලැබූ, 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 21 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මාරඹ ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගි දායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි:—

(1) මාරඹ, කලුගල්ල අද්දර පදිංචි ජූලියස් ඩයස් ලොකු රණමූක මහතා.

(2) මලිදූව, හුණුගොඩතැන්නවත්ත පදිංචි හිරඹුරගමගේ ජේම්ස් ඩයස් සමරසිංහ මහතා.

(3) මලිදූව, ඇහැලපේ පදිංචි සන්නසූරියගේ කරෝලිස් මහතා.

(4) අකුරැස්ස, මලිදූව, උඩෝවිට පදිංචි ගීතසේන වික්‍රම රත්න ගුණසේකර මහතා.

(5) අකුරැස්ස, මලිදූව, අරඹවත්ත පදිංචි උයන්ගොඩගේ නන්දසේන මහතා.

(6) අකුරැස්ස, මලිදූව, බෝපිටිය රජයේ විද්‍යාලයෙහි දෙන් ජයතිස්ස ගමගේ ඇල්ලගොඩ මහතා.

(7) අකුරැස්ස, මලිදූව, පැලවත්ත පදිංචි කලුවැල්ල මුදලිගේ කරුණාදාස ඇලස් මහතා.

(8) මාරඹ, ලේනම, දීගල "සෝමිනිවස" හි පදිංචි ඉහල ලන්දගේ පුන්‍යසිරි මහතා.

(9) මාරඹ, ලේනම, වැරැල්ලගල පදිංචි අබේවික්‍රම දිසා නායක ඩේවිඩ් දියස් මහතා.

(10) මාරඹ, ලේනම, අලවත්තගොඩ පදිංචි දිසානායක චන්ද්‍රදාස මහතා.

(11) මාරඹ, දීගල, දීගලකැඩේ පදිංචි ඉහලලන්දගේ ගුණපාල මහතා.

(12) අකුරැස්ස, දියලපේ, ඕලමාගොඩ පදිංචි ජයවික්‍රම අබේගුණවර්ධන සරණසිරි මහතා.

(13) අකුරැස්ස, දියලපේ, කයුරන්මුල්ල පදිංචි අමරපාල ජයවික්‍රම අබේගුණවර්ධන මහතා.

(14) මලිදූව, දෙදියගල, දෙල්සේන පදිංචි සෝමරත්න කරුණායක මහතා.

(15) මලිදූව, කැටැන්විල පදිංචි ලියනගමගේ හේමසිරි මහතා.

(16) මලිදූව, දෙදියගල, "සූරියවිල" හි පදිංචි සන්නසූරිය දොන් ත්‍රෝනිස් මහතා.

(17) මලිදූව, නාවලගොඩ පදිංචි හේවා කොට්ටගේ ජෝන් පීරිස් මහතා.

(18) මලිදූව, එරමුදුගොඩ පදිංචි කරසිං ආරච්චිගේ ආරියදාස මහතා.

(19) දියලපේ, නෙරලුව පදිංචි විජේසිංහ නන්දදාස මහතා.

(20) අකුරැස්ස, ගංහැල, "සිසිල" හි පදිංචි නෝමන් ඩග්ලස් විජේසිංහ සෙනෙවිරත්න ගුණතිලක මහතා.

(21) අකුරැස්ස, අස්මාගොඩ, "අභය" හි පදිංචි විදාන ගමගේ පින්තේරිස් අබේවික්‍රම මහතා.

(22) අකුරැස්ස, ගංහැල, ඇල්ලල මහගෙදරවත්ත පදිංචි හේවාගේ උදාරිස් මහතා.

(23) අකුරැස්ස, ඉඹුල්ගොඩ පදිංචි දහනායක යාපා බැනී මහතා.

(24) අකුරැස්ස, ඉළුප්පැල්ල පදිංචි පතිරනගේ ආරියතිලක මහතා.

(25) අකුරැස්ස, හක්ගොඩ පදිංචි දියස් ලොකු කොඩිකාර මහතා.

(26) අකුරැස්ස, හක්ගොඩ පදිංචි විලියම් වික්‍රමරත්න ගුණසේකර මහතා.

(27) අකුරැස්ස, මාරඹ දකුණ පදිංචි වොලී ඩයස් සිරිවර්ධන මහතා.

(28) මල්දූව, වැලිකැටිය පදිංචි පොඩි සිංඤෝ හේවාගේ මහතා.

(29) මල්දූව, කැටුන්විල පදිංචි හර්මානිස් ඩයස් ලියන ගුණවර්ධන මහතා.

(ආ) මාරඹ, කලුගල්ල අද්දර පදිංචි ජුලියස් ඩයස් ලොකුරණමුක මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

එම්. එච්. එම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

1-506/1

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් මොහමඩ් හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම—

(අ) 1969 ජූනි මස 6 දින අංක 14,857 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ, 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 6 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ ගෝනපීනුවල-මීටියාගොඩ ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගි දායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) ගෝනපීනුවල බටහිර, ස්වදේශීය ඖෂධාලයෙහි පදිංචි කිඹියගෙයි ජයසේන ගුණතිලක මහතා.

(2) ගෝනපීනුවල බටහිර, බද්දේගම පාරේ පදිංචි කාරිය වසන් තන්තිරිගේ ධර්මදාස මහතා.

(3) ගෝනපීනුවල බටහිර, ඇලපොලවත්ත පදිංචි බන්දු සිරි විජේවික්‍රම මහතා.

(4) ගෝනපීනුවල බටහිර, "ආරිය සෙවන" හි පදිංචි කාරියවසන් තන්තිරිගේ ආරියපාල මහතා.

(5) ගෝනපීනුවල නැගෙනහිර පදිංචි කොරොට්ටගොඩ ගමගේ පීටර් ද සිල්වා මහතා.

(6) හික්කඩුව, ආරච්චිකන්ද හි පදිංචි තුයියාහන්දි ඩේවිඩ් ද සිල්වා මහතා.

(7) හික්කඩුව, පතන පදිංචි කටුකොලිහගමගේ ලැන්ට් චන්ද්‍රදාස කාරියවසම් මහතා.

(8) හික්කඩුව, ආරච්චිකන්ද පදිංචි ලේකම්වසම් හික්කඩුව ලියනගේ ආතර් ද සිල්වා මහතා.

(9) මීටියාගොඩ, මානම්පිට පදිංචි ත්‍රිමාවිතාන පියදාස ගුණසේකර මහතා.

(10) මීටියාගොඩ, මානම්පිට පදිංචි කාරියවසම් ලොකුගමගේ ඩේවිඩ් අප්පුහාමි මහතා.

(11) මීටියාගොඩ, මානම්පිට පදිංචි වත්තිආච්චි කංකානම්ගේ සිරිසේන මහතා.

(12) ගෝනපීනුවල, බේරතුඩුව පදිංචි මහින්දපාල නානායක්කාර මහතා.

(13) තෙල්වත්ත, මැටිවල, "කුසුම් නිවස" හි පදිංචි කංකාන්ත්‍රි ධර්මදාස ගුණවර්ධන මහතා.

(14) මීටියාගොඩ, කිරිදිඇල පදිංචි නානායක්කාරවසම් වල කඩගමගේ අබේරත්න මහතා.

(15) අළුත්වල, කොස්ගහවේල්ල පදිංචි රොබට් රිචඩ් විජේනායක මහතා.

(16) තෙල්වත්ත, මැටිවල, "වෙදමැදුර" හි පදිංචි නානායක්කාරවසම් විලකඩගමගේ ඒබල් ද සිල්වා මහතා.

(17) තෙල්වත්ත, මැටිවල පදිංචි එල්ලගොඩගේ මාටින් රපියෙල් මහතා.

(18) මීටියාගොඩ, දික්දැලිය පදිංචි තුයියගම්හේවා ගුණසේන ද සිල්වා මහතා.

(19) මීටියාගොඩ, "ශ්‍රියානි" හි පදිංචි විල්බට් ලොයිඩ් විමලසූරිය මහතා.

(20) මීටියාගොඩ තඹහිටිය "ලාල් සෙවන" හි පදිංචි තුයියගම් හේවා පියදාස ද සිල්වා මහතා.

(21) මීටියාගොඩ, "ලුම්බිනි" හි පදිංචි ග්‍රැගරි ඩයස් දිසානායක මහතා.

(22) මීටියාගොඩ, වැකඩ පදිංචි රාහුබද්දෙකංකානම්ගේ දයානන්ද මහතා.

(23) ගෝනපීනුවල, සුරම්‍ය පාර පදිංචි කිඹියගේ රේඩී ද සිල්වා මහතා.

(24) ගෝනපීනුවල, වුඩ්ලන්ඩ් වත්තේ පදිංචි මාජරි ඇවරි කොඩිප්පිලි මහත්මිය.

(25) ගෝනපීනුවල, "සුරම්‍ය" හි පදිංචි කිඹියගේ පියදාස මහතා.

(26) ගෝනපීනුවල, "ග්‍රීන්ෆීල්ඩ්" හි පදිංචි කොඩිකාර පටබැඳි ජයසෝම කොඩිකාර මහතා.

(27) ගෝනපීනුවල, බද්දේගම පාරේ, "පියදර්ශනී" හි පදිංචි ගුරුගේ ජිනපාල මහතා.

(28) ගෝනපීනුවල, මග්ගොඩගෙවත්තේ පදිංචි වීමල සේන ගුරුගේ මහතා.

(29) අළුත්වල, මහගංගොඩ පදිංචි නානායක්කාරවසම් කරිජ්ජවත්තගේ සිරිසේන මහතා.

(30) හික්කඩුව, පතනහන්දියේ පදිංචි දොන් පියදාස සූරියආරච්චි මහතා.

(31) තෙල්වත්ත, මැටිවල පදිංචි විල්බට් කහගොඩ ආරච්චි මහතා.

(32) අළුත්වල, මහගංගොඩ පදිංචි ගාල්ලගේ සිරිතුංග මහතා.

(ආ) ගෝනපීනුවල බටහිර, ස්වදේශීය ඖෂධාලයෙහි පදිංචි කිඹියෙගෙයි ජයසේන ගුණතිලක මහතා ඉහත කී සභාවේ සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

එම්. එච්. එම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

1-506/2

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, මොහමඩ් හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම—

(අ) 1969 ජූනි 6 දින අංක 14,857 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 20 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ කෝට්ටෙගොඩ ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගි දායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) කෝට්ටෙගොඩ, පාතගම දකුණ, "මානෙල් විලා" හි පදිංචි මහදූර සුදුසිංහ ජිනදාස මහතා.

(2) ගන්දර, තලල්ල දකුණ පදිංචි ඉලංගන්ගේ නින්නේ පිස් සිල්වා මහතා.

(3) කෝට්ටගොඩ, පාතෙගම දකුණ ලොම්බගෙවත්ත පදිංචි කුනම්ගේ ඩේවිඩ් මහතා.

(4) කෝට්ටෙගොඩ, පාතෙගම දකුණ, ලිඳවත්ත පදිංචි දොන් දිදෙරෙක් කුරුප්පු නානායක්කාර මහතා.

(5) කෝට්ටෙගොඩ, පාතෙගම දකුණ, මහගෙදරවත්ත පදිංචි සිරිසේන අබේසිංහ මහතා.

(6) කෝට්ටෙගොඩ, පාතෙගම දකුණ පදිංචි රාමසුන්දර හෙට්ටිගේ ගුණදාස මහතා.

(7) කෝට්ටෙගොඩ, පාතෙගම දකුණ පදිංචි දේවසුරේන්ද්‍ර දාවිත්හාමි මහතා.

(8) කෝට්ටෙගොඩ, පාතෙගම දකුණ පදිංචි නාවුරුන්නගේ ඒමිස් සිල්වා මහතා.

(9) කෝට්ටෙගොඩ, ගොඩඋඩ පදිංචි ක්‍රිස්තෝගු බඳුගේ උපාරිස් අප්පු මහතා.

(10) කෝට්ටෙගොඩ, ගොඩඋඩ පදිංචි විදාන කන්කානම්ගේ සේමප්පු මහතා.

(11) කෝට්ටෙගොඩ, ලුණුකලපුව පදිංචි එදිරිවීර ආරුකුට්ටි ජයසූරිය පටබැඳිගේ ලැන්ට්ස් සිල්වා මහතා.

(12) ගන්දර, තලල්ල දකුණ පදිංචි ඇල්ෆ්‍රඩ් ද සිල්වා විජේසිංහ මහතා.

(13) කෝට්ටෙගොඩ, පාතෙගම දකුණ පදිංචි ස්ටීවන් ද සිල්වා අබේසුන්දර මහතා.

(14) කෝට්ටෙගොඩ, පාතෙගම දකුණ පදිංචි තුඹෙහේවා දොන් සව්දියස් ගුණවර්ධන මහතා.

(15) කෝට්ටෙගොඩ, පාතෙගම දකුණ, අමරකෝන් වත්ත පදිංචි කෝට්ටගේ පොඩි සිංඤෝ මහතා.

(16) කෝට්ටෙගොඩ, පාතෙගම දකුණ පදිංචි සමරවික්‍රම සුන්නාදෙනියේ පියදාස මහතා.

(17) කෝට්ටෙගොඩ, තලල්ල දකුණ පදිංචි සර්විස් ද සිල්වා ජාසිංහ මහතා.

(18) කෝට්ටෙගොඩ, පාතෙගම දකුණ පදිංචි රාමසුන්දරර් හෙට්ටි ආරච්චිගේ අමරියස් අප්පු මහතා.

(19) කෝට්ටෙගොඩ, ගොඩඋඩ පදිංචි කංකානම්ගේ අමරියස් සිල්වා මහතා.

(20) කෝට්ටෙගොඩ, ලුණුකලපුව, "සමනල" හි පදිංචි චාල්ස් හලප්පත්ති අමදෝරු මහතා.

(21) කෝට්ටෙගොඩ, බෙලිදෙනිය විද්‍යාලයෙහි කරොලිනා ගුණතිලක මහත්මිය.

(22) කෝට්ටෙගොඩ, පාතෙගම දකුණ, "රත්නවාස" හි පදිංචි දෝන හිමාරා වික්‍රමරත්න මහත්මිය.

(23) කෝට්ටෙගොඩ, ගොඩඋඩ පදිංචි ජූලියෝනා එදිරිවීර මහත්මිය.

(24) කෝට්ටෙගොඩ, බෙලිදෙනිය, "තෙද මැඳුර" හි පදිංචි ලියනවඩුගේ තෙදෝරිස් සිල්වා මහතා.

(25) කෙට්ටෙගොඩ, පාතෙගම දකුණ, වලව්වත්ත පදිංචි දොන් හෙන්ද්‍රික් කුරුප්පු නානායක්කාර මහතා.

(ආ) කෝට්ටෙගොඩ, පාතෙගම දකුණ, "මානෙල් විලා" හි පදිංචි මහදූර සුදුසිංහ ජිනදාස මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

එම්. එච්. එම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

1-506/3

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරන පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14 836/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, මොහමඩ් හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම—

(අ) 1968 මාර්තු 22 වන දින අංක 14,794 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 10 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ කිතුල්ගල ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගි දායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි:—

(1) මලල්පොල පදිංචි (සා. වි.) සී. ඩබ්ලිව්. සිරිවර්ධන මහතා.

(2) කිතුල්ගල, කිරිකොහුතැන්න පදිංචි කේ. ජී. පුංචි අප්පුහාමි මහතා.

(3) මලල්පොල, පොලටගම පදිංචි එච්. කේ. ඇස්. සමරසිංහ මහතා.

(4) මලල්පොල පොලටගම පදිංචි ඩී. ඒ. චන්ද්‍රදාස මහතා.

(5) තැලිගම, ගනේපල්ල පදිංචි ඒ. කේ. සේතන් සිංඤෝ මහතා.

(6) තැලිගම, ගනේපල්ල පදිංචි ඇල්. ඒ. කරුණාරත්න මහතා.

(7) වැලිහෙලතැන්න පදිංචි අගස්පතිරන්නැහැලාගේ ලොකු මහත්මයා මහතා.

(8) මලල්පොල, දොඹේපොල පදිංචි කුමාරගේ කරුණාරත්න මහතා.

(9) මල්ලපොල, අමනාවල පදිංචි කුලසූරිය ආරච්චිල්ලාගේ ජයවර්ධන මහතා.

(10) මලල්පොල, දෙඹේපොල පදිංචි එගොඩවත්ත ආරච්චිල්ලාගේ පොඩිඅප්පුහාමි මහතා.

(11) වැලිහෙලතැන්න පදිංචි මද්දුම අප්පුහාමිල්ලාගේ දොන් පවුලිස් මහතා.

(12) යටියන්තොට, නවට පදිංචි පරපිටිය ගමරාලලාගේ හේරත් සිංඤෝ මහතා.

(13) හක්බෙල්ලාවක, තණකොළවත්ත පදිංචි සැම්සන් ජේමනාත් ගුණරත්න මහතා.

(14) කිතුල්ගල, නෙලුවතුකන්ද පදිංචි ටී. ජී. ජයසේන මහතා.

(15) කිතුල්ගල, මල්වත්ත පාරේ පදිංචි ඇස්. ටී. ඇම්. රණතුංග මහතා.

(16) කිතුල්ගල පදිංචි පී. ඇම්. ගුණසේකර මහතා.

(17) කිතුල්ගල, මල්වත්ත පාරේ පදිංචි රත්නපාල කුඹුරහේන මහතා.

(18) කිතුල්ගල මල්වත්ත පාරේ පදිංචි ගුනසේන ගුණවර්ධන මහතා.

(19) කිතුල්ගල, මහබාගේ පදිංචි ඩී. ඇම්. ප්‍රේමරත්න මහතා.

(20) කිතුල්ගල, මහබාගේ පදිංචි ඇස්. පී. ඒ. ජයවර්ධන මහතා.

(21) කිතුල්ගල, හෙල්අරඹ පදිංචි එච්. ජී. ජෝන් සිංඤෝ මහතා.

(22) මලල්පොල පදිංචි කන්දෙගමරාලලාගේ අමරපාල මහතා.

(23) කිතුල්ගල, ගෝනගමුව පදිංචි කන්දේලේකම්ලාගේ ජේම්ස් සිංඤෝ හෙවත් ජෝන් සිංඤෝ මහතා.

(24) වැලිහෙලතැන්න, පොල්පිටිය පදිංචි යද්දෙස්සලාගේ පිංසේතුවා මහතා.

(25) තැලිගම පදිංචි අම්පාන විදානලාගේ රණසිංහ මහතා.

(26) කිතුල්ගල, පරවලතැන්න පදිංචි වැලිවිට විදානෙලාගේ සිරිසේන මහතා.

(27) කිතුල්ගල, මහබාගෙ පදිංචි කේ. ජී. හෙන්ද්‍රික් සිංඤෝ මහතා.

(28) හක්බෙල්ලාවක, බදුල්ලවල පදිංචි ගජසිංහ ආරච්චිගේ හේරත් සිංඤෝ මහතා.

(29) මලල්පොල පදිංචි දොඩාවත්ත විදානෙලාගේ සිරිවර්ධන මහතා.

(ආ) මලල්පොල පදිංචි (සා. වි.) සී. ඩබ්ලිව්. සිරිවර්ධන මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තෙකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

එම්. එච්. එම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

1-582/1

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, මොහමඩ් හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම—

(අ) 1969 ජූලි 4 වැනි දින අංක 14,861 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 2 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ උඩුගහපත්තු ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගි ආයකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) පොල්ගස්ඕවිට, හෙරළියාවල වාසී පූජ්‍ය වෙඩේරුවේ අනෝමදස්සී ස්ථවිරයන් වහන්සේ.

(2) පොල්ගස්ඕවිට, අම්බලංගොඩ, ශ්‍රී සුදර්මාරාම වාසී පූජ්‍ය හිත්තැපියේ උදිත ස්ථවිරයන් වහන්සේ.

(3) පොල්ගස්ඕවිට, මත්තෙගොඩ පදිංචි දොන් සේපාලං නානායක්කාර මහතා.

(4) පොල්ගස්ඕවිට, සියඹලාගොඩ පදිංචි අඹේගොඩ ලියනගේ දොන් අර්නෝලිස් මහතා.

(5) පොල්ගස්ඕවිට, හෙරළියාවල පදිංචි මල්ලිකා ආරච්චිගේ දොන් සුවාරිස් මහතා.

(6) පොල්ගස්ඕවිට, වෙනිවැල්කොල පදිංචි වල්පොලගේ ජයවර්ධන මහතා.

(7) පොල්ගස්ඕවිට, වෑතර පදිංචි දොන් මාටින් අබේසිංහ මහතා.

(8) පොල්ගස්ඕවිට, කහතුඩුව පදිංචි දොන් සෙනෝරිස් ජයකොඩි මහතා.

(9) පිළියන්දල, සිද්දමුල්ල පදිංචි තේවහෙට්ටිගේ ගුණදාස මහතා.

(10) පොල්ගස්ඕවිට, සියඹලාගොඩ පදිංචි සිල්පාදිපතිගේ ජූලිස් ස්ටැර්ක් විජයසේකර මහතා.

(11) පොල්ගස්ඕවිට, සියඹලාගොඩ පදිංචි මාසිංහගේ පියසේන විජයවර්ධන මහතා.

(12) පොල්ගස්ඕවිට, අම්බලන්ගොඩ පදිංචි ඉලේපෙරුමගේ පබිලිස් පෙරේරා මහතා.

(13) පොල්ගස්ඕවිට, අම්බලන්ගොඩ පදිංචි දයා දීන බන්ධු අබේසිංහ මහතා.

(14) පොල්ගස්ඕවිට, හෙරළියාවල පදිංචි කුමාරන්නැහැලාගේ දොන් සවනිස් මහතා.

(15) පොල්ගස්ඕවිට, හෙරළියාවල පදිංචි එල්ලප්පුලි අච්චිගේ දොන් දියෝනිස් ජයවර්ධන මහතා.

(16) පොල්ගස්ඕවිට, පාලාගම පදිංචි වීරසිංහගේ තෝගිස් අල්විස් මහතා.

(17) පොල්ගස්ඕවිට, පිලාවල පදිංචි තණවීර අච්චිගේ දොන් පබිලිස් අප්පුහාමි මහතා.

(18) පොල්ගස්ඕවිට, වෑතර පදිංචි පැටිකිරිගේ විමලසේන මහතා.

(19) පොල්ගස්ඕවිට, කහතුඩුව පදිංචි දොන් ගුණෝරිස් අබේසිංහ මහතා.

(20) පොල්ගස්ඕවිට, කහතුඩුව, "රමණී" හි පදිංචි දොන් ගාබ්‍රියෙල් අබේසිංහ මහතා.

(21) කිරිවත්තුඩුව පදිංචි ජයසිංහගේ පියසිරි පෙරේරු හේමචන්ද්‍ර මහතා.

(22) කිරිවත්තුඩුව, දියගම, අංක 90, "සිසිල" හි පදිංචි ගම්මන්පිල අප්පුහාමිලාගේ දොන් වෝල්ටර් කරුණාරත්න මහතා.

(23) කිරිවත්තුඩුව, දියගම, අංක 69/1 හි පදිංචි කුරුප්පු අච්චිගේ දොන් ඩේවිඩ් නොහොත් දෙනමින් මහතා.

(24) මාගම්මන පදිංචි උඩුවනගේ සීමන් මහතා.

(25) හෝමාගම, දීපන්ගොඩ පදිංචි කරුණානායකගේ විජේසේන කුලරත්න මහතා.

(26) පිළියන්දල, සිද්දමුල්ල පදිංචි ජයසිංහ සමරකෝන් මහතා.

(27) පොල්ගස්ඕවිට, උන්දුරුගොඩ පදිංචි තණවීර අච්චිගේ දොන් සෝබස් සිංඤෝ මහතා.

(28) පොල්ගස්ඕවිට, කිරිගම්පමුණුව පදිංචි අතුකෝරාල්ලාගේ දොන් හරමානිස් විජේතුංග මහතා.

(29) හෝමාගම, දීපන්ගොඩ, වෙදගෙදර හි පදිංචි පබිලිස් සිංඤෝ කොතලාවල මහතා.

(ආ) පොල්ගස්ඕවිට, මත්තෙගොඩ පදිංචි දොන් සේපාල නානායක්කාර මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

එම්. එච්. එම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 ජනවාරි 19 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

1-582/2

---

## නිවැරදිකිරීම

වවුනියා දිස්ත්‍රික්කයේ රජයේ දිසාපතිගේ 1969. 4. 20 දින නියෝගය පිළිදි අංක 14,858 සහ 1969. 6. 13 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීම අවලංගු කිරීම සඳහා ඔහු විසින් 1969. 11. 27 දින කරණ ලද නියෝගය අනුව අංක 14,884 සහ 1969. 12. 12 ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීම හේතුකොට ගෙන, මා විසින් 1969. 11. 30 දින කරණ ලද දැනුම්දීම අනුව අංක 14,886 සහ 1969.12.26 ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පෙණෙන, ඡන්ද දිස්ත්‍රික්ක "සීසී", "ඩීඩී", "ඊඊ" සහ "ඇෆ්ඇෆ්" සඳහා ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 10 (3) වැනි වගන්තිය යටතේ මා විසින් කරණ ලද සංශෝධනය අවලංගු කළ සේ සලකන බව පොදු දැනගැනීම සඳහා මෙයින් දැනුම්දෙනු ලැබේ.

න. පත්මනාදන්,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාශ අංක 86, වවුනියාව.

මැතිවරණ කාර්යාලය,
කච්චේරිය, වවුනියාව,
1970 ජනවාරි මස 16 වෙනි දින.

1-831

---

## නිවැරදි කිරීමයි

අංක 44 දරණ කුණ්ඩසාලේ මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් 1969 නොවැම්බර් මස 30 වැනි දින අංක 14,879/17 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 10 (3) වැනි වගන්තිය යටතේ වූ නිවේදනයේ,

"සී" අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශය සඳහා වූ විස්තරයේ දක්වෙන "සිරිවිල්මත්ත වසම" වෙනුවට "සිරිමල්වත්ත වසම" යන්න යෙදීමෙන්,

"කිව්" අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශය සඳහා වූ විස්තරයේ දක්වෙන "අංක 181 දරණ හුරීකඩුව මඩිගේ වසම" වෙනුවට "අංක 181 දරණ හුරීකඩුව මඩිගේ වසම" යන්න යෙදීමෙන්

සහ

"කිව්" අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශය සඳහා වූ විස්තරයේ දක්වෙන "කුරගන්දෙණිය හුරීකඩුව, මඩිගේ උඩගම් මැද්ද." යන්න වෙනුවට "කුරගන්දෙණිය, හුරීකඩුව මඩිගේ උඩගම්මැද්ද," යන්න යෙදීමෙන්,

නිවැරදි කොට කියවිය යුතුය.

ආර්. කේ. චන්ද්‍රානන්ද ද සිල්වා,
අංක 44 දරණ කුණ්ඩසාලේ මැතිවරණ කොට්ඨාශයේ,
සහකාර ලියා පදිංචි කිරීමේ නිලධාරී,

1970 ජනවාරි මස 8 දින,
මහනුවර මැතිවරණ කාර්‍යාලයේ දීය,

1-509

# විවිධ දෙපාර්තමේන්තු දත්වීම්

## වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසි—1951

### 3 වැනි රෙගුලාසිය යටතේ නිවේදනය

වර්ෂ 1951 අප්‍රේල් මස 13 වනදා අංක 10,234 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සහ 1951 ජූනි මස 29 ද අංක 10,263 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසියෙන් සංශෝධනය කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසිය 1951 ද 1952 මැයි 2 වැනි දින අංක 10,390 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසිය ද 1956 ජූනි මස 21 වැනි දින අංක 10,943 රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසියද 1966 සැප්තැම්බර් මස 30 වැනි දින අංක 14,715 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසිය ද පහත සඳහන් විහාර, කෝවිල් සහ පල්ලි වලට 1970 වර්ෂය තුළදී කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් බල පැවැත්වෙන කාලය වශයෙන් උත්සව වාර මෙයින් නියම කරන ලදී.

| | | පටන් ගන්නා දින | අවසන් වන දින |
|---|---|---|---|
| 1. | සාන්ත අන්තෝනි පල්ලිය, පාලයිතීව් | ... 1970. 2.24 | ... 1970. 2.28 |
| 2. | මරුතඩි පිල්ලයියාර් කෝවිල්, මානිපායි | 1970. 3.29 | ... 1970. 4.15 |
| 3. | නයිනතීව් බෞද්ධ විහාරය, වෙසක් | ... 1970. 5.19 | ... 1970. 5.21 |
| 4. | සිද්ධවරම් අම්මන් කෝවිල | ... 1970. 5.25 | ... 1970. 6. 8 |
| 5. | නාගදීප නාගපූෂණ අම්මන් කෝවිල | ... 1970. 6. 5 | ... 1970. 6 20 |
| 6. | නයිනතීව් බෞද්ධ විහාරය, පොසොන් | 1970. 6.17 | ... 1970. 6 19 |
| 7. | සාන්ත සෙබස්තියන් පල්ලිය, පුතුමඩම්, මුල්ලියන් | 1970. 6.29 | ... 1970. 7. 8 |
| 8. | මාවඩ්ඩිපුරම් කන්දසාමි කෝවිල | ... 1970. 7. 8 | ... 1970. 8. 2 |
| 9. | සාන්ත ජේම්ස් පල්ලිය, කිලාලි | ... 1970. 7.16 | ... 1970. 7.25 |
| 10. | අවලේඩි ඔෆ් ද හෝලි රෝසරි පල්ලිය, සින්නමඩු | 1970. 7.27 | ... 1970. 8. 5 |
| 11. | කීරිමලේ ආඩි අම්ඩායෙයි | ... 1970. 7.31 | ... 1970. 8. 1 |
| 12. | සෙල්ල සන්නදි කෝවිල, කොන්ඩයි මනාරු | 1970. 8.31 | ... 1970. 9.15 |
| 13. | අවලේඩි ඔෆ් ද ගුඩ් වොයේජ් පල්ලිය, සාඩි, වෙලනෙයි | 1970. 9.15 | ... 1970. 9.24 |
| 14. | වල්ලිපුරම් කෝවිල, තුන්නාලෙයි | ... 1970. 9.29 | ... 1970.10.15 |
| 15. | සෙල්ල සන්නදි කෝවිල, තොන්ඩයි මනාරු, කන්දශස්ටී | 1970.10.30 | ... 1970.11. 5 |

එෆ්. සී. පීටර්ස්,
යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ජනවාරි මස 18 වෙනි දින,
යාපනය දිසාපති කාර්යාලයේදී ය.

1-820

---

## සමුපකාර සමිති පිළිබඳ ආඥපනත (124 අධිකාරිය)

### සමුපකාර සමිති වසා දැමීමේ කටයුතු අවසන් කිරීම

පහත සඳහන් සමුපකාර සමිති ඒ ඒක ඒක සමිතියේ නම ඉදිරියෙහි සඳහන් කර තිබෙන දිනයෙහි වසා දමන ලද බව, සමුපකාර සමිති පිළිබඳ ආඥපනතේ 52(2) වෙනි වගන්තිය අනුව, මෙයින් දැනුම් දෙනු ලැබේ.

| සමිතියේ නම | වසා දමන ලද දිනය |
|---|---|
| (1) සීමාසහිත පලාපොත සමුපකාර කඩ සමිතිය ... | 69. 10. 2 |
| (2) සීමාසහිත හිඳගොඩ සමුපකාර කඩ සමිතිය ... | 69. 10. 4 |
| (3) සීමාසහිත බැරගම කොලණියේ සමුපකාර කඩ කඩ සමිතිය ... ... | 69. 10. 4 |
| (4) සීමාසහිත මොරහැල සමුපකාර කඩ සමිතිය... | 69. 10. 5 |
| (5) සීමාසහිත බදුල්ල සමුපකාර කඩ සමිතිය ... | 69. 10. 7 |
| (6) සීමාසහිත දිගහතැන්න කුලගනා සමුපකාර සමිතිය | 69. 10. 8 |
| (7) සීමාසහිත හිමිදුරාව විවිධ සේවා සමුපකාර සමිතිය | 69. 10.15 |
| (8) සීමාසහිත බ්ලැක් ස්ටෝර් සමුපකාර කඩ සමිතිය | 69. 10.19 |
| (9) සීමාසහිත යටිවත්ත ඉහළ කොටස විවිධ සේවා සමුපකාර සමිතිය ... ... | 69. 10.19 |
| (10) සීමාසහිත වැල්ලවාය ගම්මුලාදෑනීන්ගේ සකසුරුවම්කම හා මුදල් ඉතිරි කිරීම පිළිබඳ සමුපකාර සමිතිය ... ... | 69. 10.19 |
| (11) සීමාසහිත හෙලකඳුරුගමුව කාන්තා සකසුරුවම්කම හා ඉතිරිකිරීමේ සමුපකාර සමිතිය ... | 69. 10.19 |
| (12) සීමාසහිත හැතැක්ම සමුපකාර කඩ සමිතිය... | 69. 10.20 |
| (13) සීමාසහිත අළුත්ගම මීගම ගමනාගමන සමුපකාර සමිතිය ... ... | 69. 11. 2 |
| (14) සීමාසහිත පැලපිටියාගොඩ සමුපකාර කඩ සමිතිය | 69. 11.20 |
| (15) සීමාසහිත කිරිවත්එලිය සමුපකාර කඩ සමිතිය | 69. 11.20 |
| (16) සීමාසහිත බොලොස්සගම සේරුපිට ගොවි ද්‍රව්‍ය නිපදවීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිය | 69. 11.20 |

ආර්. බී. රාජගුරු,
සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්,
සහ සමුපකාර සමිති නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්.

1970 ජනවාරි මස 18 වෙනි දින,
කොළඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේදීය.

1-770

---

## දන්වීමයි

### කො/දෙමටගොඩ වේළුවන පිරිවෙන, කොළඹ 9

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ 9, දෙමටගොඩ, වේළුවන පාරේ අංක 74 දරණ වේළුවනාරාමයෙහි පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන කණිෂ්ඨ පිරිවෙනක් ලෙස 6 .4.1 දින සිට තාවකාලික වශයෙන් ලියාපදිංචි කළ බව මෙයින් දන්වමි.

වී. ජී. ඩී. මුණසිංහ,
කොළඹ ප්‍රදේශයේ අධ්‍යාපනාධ්‍යක්ෂ.

1970 ජනවාරි මස 18 වැනිදා,
කොළඹ 7, ග්‍රීන්පාත්,
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

1-837

---

## 1961 අංක 33 දරණ කෘෂි ද්‍රව්‍ය (නියමිත මිල සහ වී පැහීම හා කෙටීමේ පාලනය) පනත

### 3 වැනි වගන්තිය යටතේ කරන නියෝග

ගොවිජන සේවා කොමසාරිස් තැන්පත් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1961 අංක 33 දරණ කෘෂි ද්‍රව්‍ය (නියමිත මිළ හා කෙටීමේ පාලන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මට පැවරී ඇති බලතල අනුව, නියමිත මිළ උපදේශක කාරක සභාව සමග සාකච්ඡා කිරීමෙන් පසු, කෘෂිකර්ම හා ආහාර ඇමති තුමාගේ අනුමැතිය ඇතිව, මුදල් ඇමති තුමා සමග සාකච්ඡා කිරීමෙන් පසුව ලබාගත් බලයද ඇතිව, මෙම නියෝගයෙන් මෙහි පහත සඳහන් උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කෘෂි ද්‍රව්‍ය සඳහා එම උප ලේඛනයේ 2 වෙනි තීරයේ දක්වා ඇති සහතික මිළ ගණන් 1970 ලිත් වර්ෂය සඳහා නියම කරමි.

ඇස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970.1.13 වැනි දින,
කොළඹදීය.

### උප ලේඛනය

| | 1 වෙනි තීරය | | 2 වෙනි තීරය | රු. | ශ. |
|---|---|---|---|---|---|
| 1. | වී ... | ... | බුසලක් | 14 | 0 |
| 2. | බඩ ඉරිඟු ... | ... | හොණ්ඩරයක් | 24 | 64 |
| 3. | කුරක්කන් වර්ග 1 | ... | ,, | 15 | 0 |
| | වර්ග 2 | ... | ,, | 13 | 0 |
| 4. | ඉඳල් ඉරිඟු ... | ... | ,, | 20 | 16 |
| 5. | තෝර පරිප්පු (ඇට) | ... | ,, | 56 | 0 |
| 6. | මෙරට කපු වර්ග 1 | ... | ,, | 64 | 0 |
| | අන්තර් වර්ගය | ... | ,, | 50 | 0 |
| | වර්ග 2 | ... | ,, | 40 | 0 |
| | වර්ග 3 | ... | ,, | 23 | 50 |
| 7. | අබ ... | ... | ,, | 67 | 20 |
| 8. | තල ... | ... | ,, | 38 | 0 |
| 9. | මිරිස් වර්ග 1 ... | ... | ,, | 252 | 0 |
| | වර්ග 2 ... | ... | ,, | 196 | 0 |
| | බාල වර්ගය | ... | ,, | 112 | 0 |
| 10. | මුං ඇට වර්ග 1 ... | ... | ,, | 67 | 20 |
| | වර්ග 2 ... | ... | ,, | 61 | 60 |
| 11. | සියඹලා ... | ... | ,, | 33 | 60 |
| 12. | කළු ගම්මිරිස් ... | ... | ,, | 140 | 0 |
| 13. | මෑ ඇට (ආර්ලිංටන් වර්ගය) | ... | ,, | 67 | 20 |
| 14. | මෑ ඇට ... | ... | ,, | 42 | 56 |
| 15. | රට කජු ... | ... | ,, | 49 | 28 |
| 16. | විශාලි කහ ... | ... | ,, | 130 | 0 |

| | 1 වෙනි තීරය | | 2 වෙනි තීරය | |
|---|---|---|---|---|
| | | | රු. | ශ. |
| 17. | කෝපි වර්ග 1 ... ... | හොණ්ඩරයක් | 224 | 0 |
| | වර්ග 2 ... ... | ,, | 154 | 0 |
| 18. | අර්තාපල් ... ... | ,, | 44 | 80 |
| 19. | රතුළූණු : | | | |
| | ජනවාරි ... ... | ,, | 34 | 72 |
| | පෙබරවාරි ... ... | ,, | 31 | 36 |
| | මාර්තු ... ... | ,, | 25 | 76 |
| | අප්‍රේල් ... ... | ,, | 28 | 0 |
| | මැයි සහ ජූනි ... ... | හොණ්ඩරයක් | 31 | 36 |
| | ජූලි සහ අගෝස්තු ... | ,, | 25 | 76 |
| | සැප්තැම්බර් ... ... | ,, | 29 | 12 |
| | ඔක්තෝබර් ... ... | ,, | 31 | 36 |
| | නොවැම්බර් සහ දෙසැම්බර් ... | ,, | 34 | 72 |
| 20. | බොම්බයි ළූණු ... ... | ,, | 44 | 80 |
| 21. | සුදු ළූණු ... ... | ,, | 168 | 0 |

1–693

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදනය බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

## උපලේඛනය

1970

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි ... | 70. 1. 2 | සිකුරාද ... | 69.12.26 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 1. 9 | සිකුරාද ... | 70. 1. 2 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 1.16 | සිකුරාද ... | 70. 1. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 1.23 | සිකුරාද ... | 70. 1.16 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| | 70. 1.29 | බ්‍රහස්පතින්ද ... | 70. 1.21 | බදාද | පෙ.ව. | 12.00 |
| පෙබරවාරි ... | 70. 2. 5 | බ්‍රහස්පතින්ද ... | 70. 1.28 | බදාද | ප.ව. | 3.30 |
| | 70. 2.13 | සිකුරාද ... | 70. 2. 5 | බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.00 |
| | 70. 2.20 | සිකුරාද ... | 70. 2.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 2.27 | සිකුරාද ... | 70. 2.20 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| මාර්තු ... | 70. 3. 5 | බ්‍රහස්පතින්ද ... | 70. 2.27 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| | 70. 3.13 | සිකුරාද ... | 70. 3. 5 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 3.20 | සිකුරාද ... | 70. 3.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 | බ්‍රහස්පතින්ද ... | 70. 3.20 | සිකුරාද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 දෙසැම්බර් මස 12 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයකි